**සටහන 1—26**

**කම්කරු කොමසාරිස්තුමාට වාර්තා එවූ කම්කරු සංගම්වල සංඛ්‍යා තොරතුරු (අ)**

| කම්කරු සමිති | සමිති සංඛ්‍යාව | | සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 1957-58 | 1958-59* | 1957-58 | 1958-59* |
| 1. වැවිලි සහ කෘෂිකාර්මික ... ... ... ... | 27 | 30 | 552,498 | 592,270 |
| 2. කාර්මික ... ... ... ... ... ... | 65 | 69 | 65,669 | 58,851 |
| 3. ගමනාගමනය සහ පණිවුඩ හුවමාරු ... ... | 60 | 57 | 39,408 | 56,172 |
| 4. ලිපිකරු ... ... ... ... ... ... | 20 | 34 | 12,387 | 18,914 |
| 5. ශාස්ත්‍රීය වෘත්තීන් ... ... ... ... ... | 30 | 39 | 9,215 | 15,056 |
| 6. සාමාන්‍ය ... ... ... ... ... ... | 96 | 172 | 35,669 | 54,746 |
| 7. වාණිජ ... ... ... ... ... | 11 | 14 | 14,916 | 25,298 |
| 8. පාලක සහ විධායක .. ... ... ... ... | 8 | 12 | 416 | 689 |
| | 317 | 427 | 730,178 | 821,996— |

සංඛ්‍යා—කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

(අ) ලියාපදිංචි කළ අවුරුද්ද—අප්‍රේල් 1 වැනිද සිට මාර්තු 31 වැනිද දක්වා.

වැඩ වර්ජන හේතූන් පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව විසින් කරන ලද වර්ග කිරීම අනුව වැඩ වර්ජන ඇතිකිරීමෙහි ලා, වැඩි පඩි ඉල්ලීම 1954 සිට එතරම් වැදගත් හේතුවක් නොවීය 1959 දී ද මෙය එසේම පැවතුණි. වැඩි පඩි ඉල්ලීම හේතුවක් වශයෙන් ගෙන 1958 කළ වැඩ වර්ජනයන් ගේ ගණන සියයට 4.4 ක් වූ අතර 1959 දී එය සියයට 3.2 ක් විය. සේවා තත්වය පිළිබඳ ආරාවුල් නිසා උද්ගත වූ වැඩ වර්ජන සියයට 30.2 ක් වූ අතර, අස්කිරීමෙන් හෝ වැඩ නැතිවීමෙන් සහ වැටුප් ආරාවුල් නිසා වූ වැඩි පඩි ඉල්ලීම් නොවන වැඩ වර්ජන සියයට 18.2 ක් සහ 16.1 ක් විය. 1958 දී මෙන් ම වැඩ වර්ජනවලට ප්‍රධාන හේතූන් වූයේ මේ කරුණු තුනය.

# 11 මූල්‍ය තත්වය

## (අ) මුදල් සැපයුම

මුදල් සැපයුම 1959 දී රුපියල් කෝටි 10.1 කින් හෙවත් සියයට 9.4 කින් වැඩි විය. 1958දී මුදල් සැපයුම ඉහළ ගියේ රුපියල් කෝටි 3.66 ක් හෙවත් සියයට 3.6 කින මේ අවුරුද්දේ මුදල් සැපයුමෙහි ඉහළ නැගීම පසු ගිය අවුරුද්දට වඩා නිරන්තරව පැවතිණ. 1958 ප්‍රථම භාගයේ දී මුදල් සැපයුම පහළ වැටුන අතර ඉහළ නැංගේ දෙවැනි භාගයේ දී පමණෙකි. 1959 දෙවැනි භාගයේ දී මුදල් සැපයුම අති විශාල ලෙස ඉහළ නැගුන ද, ප්‍රථම භාගයේ දී ද, මුදල් සැපයුමෙහි මද උච්චාවචනයක් ඇති වුවද, ජූනි මාසයේ අවසානය වන විට එය රුපියල් කෝටි 1.74 කින් ඉහළ නැංගේය. මෙයින් පසු පහළ සටහනේ පෙන්වා ඇති පරිදි මෙය එකාකාරවම රුපියල් කෝටි 8.35 කින් ඉහළ නැඟ දෙසැම්බර් මාසය වන විට, රුපියල් කෝටි 117.77 ක් විය. මෙය මුදල් සැපයුම නැඟ ඇති ඉහළම මට්ටම විය. 1959 දී රුපියල් කෝටි 110.7 ක් වූ මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍යය වූ 1958 වූ කෝටි 103.7 හා සසඳන විට සියයට 6.7 කින් වැඩි වී ඇත.

* තාවකාලිකයි.

## සටහන 11-1

### මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ

| කාල ඡේදය අවසානයේ දී | 1956 | 1957 | 1958 | 1959 | 1956න් 1957ට වෙනස්. සියයට ගණන | 1957න් 1958ට වෙනස. සියයට ගණන | 1958න් 1959ට වෙනස. සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. .. | 1,060 | 1,131 | 1,014 | 1,050 | +6·7 | —10·3 | +3·6 |
| පෙබරවාරි .. .. .. | 1,054 | 1,105 | 1,016 | 1,053 | +4·9 | — 8·1 | +3·7 |
| මාර්තු .. .. .. .. | 1,048 | 1,107 | 1,023 | 1,089 | +5·6 | — 7·6 | +6·5 |
| අප්‍රේල් .. .. .. .. | 1,043 | 1,082 | 1,032 | 1,084 | +3·8 | — 4·6 | +5·0 |
| මැයි .. .. .. .. | 1,049 | 1,061 | 1,000 | 1,096 | +1·1 | — 5·7 | +9·6 |
| ජුනි .. .. .. .. | 1,056 | 1,045 | 1,015 | 1,094 | —1·0 | — 2·9 | +7·9 |
| ජුලි .. .. .. .. | 1,051 | 1,056 | 1,023 | 1,094 | +0·5 | — 3·1 | +6·9 |
| අගෝස්තු .. .. .. | 1,053 | 1,024 | 1,022 | 1,095 | —2·8 | — 0·2 | +7·1 |
| සැප්තැම්බර් .. .. .. | 1,064 | 1,046 | 1,072 | 1,128 | —1·7 | + 2·5 | +5·2 |
| ඔක්තෝබර් .. .. .. | 1,078 | 1,052 | 1,085 | 1,153 | —2·4 | + 3·1 | +6·3 |
| නොවැම්බර් .. .. .. | 1,094 | 1,049 | 1,070 | 1,170 | —4·1 | + 2·0 | +9·3 |
| දෙසැම්බර් .. .. .. | 1,127 | 1,040 | 1,077 | 1,178 | —7·7 | + 3·6 | +9·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1958 මුදල් සැපයුම වැඩි වූයේ නෝට්ටු හා කාසිවලිනි. 1959 දී මුදල් සැපයුමේ වැඩිවීම තරමක් දුරට නෝට්ටු හා කාසි වලින් වූ අතර, වැඩි වශයෙන් ඉල්ලුම් තැන්පතුවලින් විය.

1953 සිට 1959 දක්වා වාර්ෂික මුදල් සැපයුම් සැකසුම පහත දැක්වෙන සටහනෙන් දැක්වෙයි.

## සටහන 11-2

### මුදල් සැපයුමෙහි සැකසුම

රුපියල් දශ ලක්ෂ

| කාල ඡේදය අවසානයේ දී | මහජනයා සතු නෝට්ටු හා කාසි | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයු. සියයට ගණන වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයු. සියයට ගණන වශයෙන් | |
| 1953 .. .. | 335.3 | 40.6 | 491.5 | 59.4 | 826.8 |
| 1954 .. .. | 341.8 | 35.7 | 615.3 | 64.3 | 957.1 |
| 1955 .. .. | 384.5 | 35.8 | 688.4 | 64.2 | 1072.9 |
| 1956 .. .. | 401.1 | 35.6 | 725.7 | 64.4 | 1126.8 |
| 1957 .. .. | 434.9 | 41.8 | 605.2 | 58.2 | 1040.1 |
| 1958 .. .. | 529.8 | 49.2 | 546.9 | 50.8 | 1076.8 |
| 1959 .. .. | 565.0 | 48.0 | 612.7 | 52.0 | 1177.7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1958 ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 5.83 කින් හෙවත් සියයට 9.6 කින් පහළ වැටුන අතර නෝට්ටු හා කාසි රුපියල් කෝටි 9.49 කින් හෙවත් සියයට 4.8 කින් ඉහළ නැංගේය. එනමුත් 1959 දී ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 6.58 කින් හෙවත් සියයට 12.0 කින් වැඩි වූ අතර නෝට්ටු හා කාසි වැඩි වූයේ රුපියල් කෝටි 35.2 කින් හෙවත් සියයට 6.6 කින් පමණෙකි. මේ හේතුයෙන් 1958 මුදල් සැපයුමෙහි සියයට 49.2 ක් වූ නෝට්ටු හා කාසි 1959 දී සියයට 48.0 ට පහළ වැටිණ. නෝට්ටු හා කාසි මෙසේ පහත වැටුන ද මහජනයා සතු නෝට්ටු හා කාසි ප්‍රමාණය පසු ගිය අවුරුද්දට වඩා ඉහළ මට්ටමක පැවැත්තේ ය. 1958 සිට 1959 කාලය තුල නෝට්ටු හා කාසි සංසරණය වැඩිවීමට හේතු වූ සමහර කරුණු වූයේ වැටුප්වැඩිවීම, ගොවියන් විසින් රජයට විකුණන ලද වී ප්‍රමාණය වැඩිවීම සහ වත්කම් නෝට්ටු හා කාසි වශයෙන් තබා ගැනීම ආදියයි. 1959 දී ද නෝට්ටු හා කාසි සංසරණය වැඩිවීමට බලපාන ලද්දේද මේ කරුණු මය.

ඉල්ලුම් තැන්පතුවල වාර්ෂික පිරිවැටුම් ශීඝ්‍රතාව (රජයේ සහ අන්තර් බැංකු හැර), එනම් පෞද්ගලික අංශය සතු ඉල්ලුම් තැන්පතු, සංසරණය වූ වේගය 2 වන පරිශිෂ්ටයේ 11 වැනි සටහනේ පෙන්වා ඇති පරිදි 1959 දී, ඊට පෙර අවුරුදු වලට වඩා වැඩි වී ඇත. අන් රටවල මෙන් ලංකාවේ ද නෝට්ටු හා කාසි සංසරණයෙහි වේගය පිළිබඳ තොරුතුරු නොමැති හෙයින් මෙයින්, සම්පූර්ණ මුදල් වල සංසරණ වේගය මැනීමට පිළවන් කමෙක් නැත. තව ද මුදල් සැපයුමෙන් භාගයක් පමණ නෝට්ටු හා කාසි ලෙස පවත්නා ලංකාව වැනි රටක ඉල්ලුම් තැන්පතු පිරිවැටුම එතරම් ප්‍රයෝජනවත් දර්ශකයක් නොවේ.

මුදල් සැපයුමෙහි වෙනස්වීම් කෙරෙහි බලපාන හේතුන් පහත සටහනේ ලුහුඩින් දැක්වේ.

## සටහන 11—3

### මුදල් සැපයුමෙහි වෙනස්වීම.

| මුදල් සැපයුමෙහි වෙනස්වීම් කෙරෙහි බලපාන හේතුන් | 1955-56 දෙසැම්බර් අවසානය දක්වා | | 1956-57 (දෙසැම්බර් අවසානය දක්වා | | 1957-58 දෙසැම්බර් අවසානය දක්වා | | 1958-59 දෙසැම්බර් අවසානය දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණ හේතුන් | සංකෝ-චන හේතුන් | ප්‍රසාරණ හේතුන් | සංකෝ-චන හේතුන් | ප්‍රසාරණ හේතුන් | සංකෝ-චන හේතුන් | ප්‍රසාරණ හේතුන් | සංකෝ-චන හේතුන් |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. | 20.4 | — | — | 209.2 | — | 82.2 | — | 195.0 |
| 2. වෙළඳ බැංකු ගනුදෙනු | | | | | | | | |
| (අ) පෞද්ගලික අංශයට දුන් ණය .. | 93.0 | — | 55.3 | — | 53.4 | — | 9.7 | — |
| (ආ) අතැති භාණ්ඩාගාර බිල් පත් සහ රජයේ සහ රජය සහතික කළ ණය පත් | 62.8 | — | — | 7.4 | — | 39.6 | 30.2 | — |
| 3. මහ බැංකුවේ ගනුදෙනු | | | | | | | | |
| (අ) රජයට දුන් අත්තිකාරම් | — | — | 32.6 | — | 75.0 | — | 61.8 | — |
| (ආ) අතැති භාණ්ඩාගාර බිල් පත් සහ රජය සහතික කළ ණය පත් | | | | | | | | |
| (ඇ) වෙනත් වත්කම් සහ ගිණුම් .. | — | 7.7 | 42.2 | — | 100.6 | — | 191.0 | — |
| 4. වෙළඳ බැංකු සහ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සහ වෙනත් වගකීම් (ශුද්ධ) | — | 22.5 | — | 10.3 | 24.5 | — | — | 27.9 |
| 5. රජය සතු මුදල් .. | — | 31.3 | — | 38.4 | — | 68.1 | — | 23.2 |
| 6. ගැලපිලි .. | — | 60.9 | 49.3 | — | — | 36.4 | 64.0 | — |
| | 0.1 | — | — | 0.8 | 9.6 | — | — | 9.6 |
| මුළු ප්‍රසාරණ-සංකෝචන හේතු | 176.3 | 122.4 | 179.4 | 266.1 | 263.1 | 226.3 | 356.7 | 255.7 |
| මුදල් සැපයුමෙහි වෙනස්වීම් .. | +53.9 | | —86.7 | | +36.6 | | +101.0 | |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංලක්ෂය—කලින් පළ කළ සංඛ්‍යා හා අතර ඇති වෙනස පසුව කර ඇති සංශෝධන නිසාය.

පසුගිය අවුරුද්දේ මෙන් මුදල් සැපයුම් වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ රජයේ අය–වැය හිඟය පියවූ ආකාරයයි. මහ බැංකුවේ දේශීය වත්කම් හා වෙළඳ බැංකු සතු රජයේ සහ රජය සහතික කළ ණය පත් ප්‍රසාරණයෙන් හා රජයේ මුදල් ශෙෂයේ පහත බැසීමෙන් මෙය පෙනේ. ඉහත සටහනේ දක්වා ඇති පරිදි රජයට මහ බැංකුවෙන් දුන් අත්තිකාරම් ප්‍රමාණය 1958 දී රුපියල් කෝටි 7.5 කට වැඩි වූ අතර, එය 1959 දී රුපියල් කෝටි 6.18 කට වැඩි විය. මහ බැංකු සතු රජයේ හා රජය සහතික කළ ණයපත් සහ භාණ්ඩාගාර බිල්පත් 1958 දී රුපියල් කෝටි 10.06 කින් වැඩි වූ අතර 1959 දී රුපියල්කෝටි 19.10 කින් ඉහළ ගියේය. අනිකුත් වත්කම් සහ ගිනුම් (ශුද්ධ) රුපියල් කෝටි 2.79 කින් පහළ ගිය බැවින් මහ බැංකුවේ දේශීය වත්කම්වල ශුද්ධ වැඩිවීම රුපියල් කෝටි 22.48 ක් විය. වෙළඳ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් 1958 දී රුපියල් කෝටි 3.69 කින් පහළ ගිය අතර 1959 දී රුපියල් කෝටි 3.02 කින් ඉහළ ගියේය. රජයේ රුපියල් මුදල්, රුපියල් කෝටි 6.40 කින් පහළ වැටිණ. 1958 දී රුපියල් මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 3.64 කින් ඉහළ ගියේය.

ජාත්‍යන්තර ගනුදෙනුවල අවාසියේ ප්‍රතිඵලයක් වශයෙන් පිට රට බැංකු සතු විදේශීය වත්කම් රුපියල් කෝටි 19.50 කින් පහළ බැස යාමෙන් ඇති වූ සංකෝචනය නිසා ප්‍රසාරණාත්මක බලපෑම මධ්‍යස්ථ විය. මේ සමගම වෙළඳ බැංකුවල කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතු රුපියල් කෝටි 2.32 කින් ඉහළ ගිය අතර ගැලපිලි ශීර්ෂයන්, රුපියල් දශ ලක්ෂ 9.6 කින් පහළ වැටිණ. එසේ වුව ද, මුදල් සැපයුම ඉහළ යෑම වැළැක්වීමට මේ සංකෝචන බලපෑම ප්‍රමාණවත් නොවීය.

ජාත්‍යන්තර ගනු දෙනුවල අවාසියක් ඇති වුවද, මුදල් සැපයුම ඉහළ ගිය බව 1958 වාර්ෂික වාර්තාවෙන් පෙන්වාදෙන ලදී. මෙයට ප්‍රධාන හේතුව වූයේ රජයේ අය–වැය හිඟය පියවීමට, විශාල වශයෙන් මහ බැංකු ණය මගින් මුදල් සැපයුම වැඩිවීමය. 1959 දී රජයේ අයවැය හිඟය මුදල් සැපයුම කෙරෙහි බලපෑම වඩාත් වැඩිවිය. ජාත්‍යන්තර ගනුදෙනු අවාසිය නිසා බැංකු සතු විදේශීය වත්කම 1958 දීට වඩා විශාල ප්‍රමාණයකින් අඩු විය. එය 1958 දී රුපියල් කෝටි 8.22 ක් වූ අතර, 1959 දී රුපියල් කෝටි 9.5 ක් විය. රජය බැංකුවලින් ලබා ගත් ණය ප්‍රමාණය (මහ බැංකුව ඇතුළුව) 1958 දී රුපියල් කෝටි 18.6 ක් වූ අතර 1959 දී රුපියල් කෝටි 28.3 ක් විය.

## (ආ) බැංකු ගනුදෙනු සහ ණය දීම්

### (1) මහ බැංකුව.

දෙවැනි පරිශිෂ්ටයේ පස්වැනි සටහනේ පෙන්වා ඇති පරිදි රජයේ අය වැය හිඟය පියවීම සඳහා 1959 දී රජයට දුන් මහ බැංකු ණය ප්‍රමාණයෙහි සැලකිය යුතු ප්‍රසාරණයක් ඇති විය. මහ බැංකුවෙන් රජයට දුන් අත්තිකාරම් රුපියල් කෝටි 6.18කින් ද, මහ බැංකුව වෙත වූ රජයේ හා රජය සහතික කළ ණය පත් රුපියල් කෝටි 19.10කින් ද වැඩි විය. මහ බැංකුව නිතර වෙළඳ බැංකුවලට ණය දුන්න ද, අවුරුද්ද අවසාන වත්ම වෙළඳ බැංකු විසින් මේ ණය සම්පූර්ණයෙන් ම බේරුම් කර තිබිණ.

මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් කෝටි 15.20කින් පහළ වැටිණ. මහ බැංකුව විසින් වෙළඳ බැංකුවලට හා රජයට විකුණන ලද විදේශීය මුදල් වත්කම්, ඔවුන්ගෙන් මිල දී ගත් විදේශීය මුදල් වත්කම්වලට වඩා අධික විය. මෙයට හේතුව වූයේ ජාත්‍යන්තර ගනුදෙනුවලින් සිදු වූ අවාසිය සහ රජය විසින් ජාත්‍යන්තර මුදල් අරමුදලට ගෙවන ලද රුපියල් කෝටි 3.57ක විශේෂ දයක දීමනාවය. අනිකුත් වත්කම් සහ ගිණුම් ද රුපියල් 56 ලක්ෂයකින් පහළ වැටිණ. මේ අනුව 1959 දී මහ බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් කෝටි 9.51කින් වැඩි විය.

වගකීම් අංශයේ නෝට්ටු හා කාසි නිකුතුව, රුපියල් කෝටි 4.30 සිට රුපියල් කෝටි 62.13 දක්වා වැඩි විය. ජාත්‍යන්තර සංස්ථා සහ වෙළඳ බැංකු සතු තැන්පතු පිළිවෙළින් රුපියල් කෝටි 2.69කින් සහ රුපියල් 39 ලක්ෂයකින් ඉහළ ගියේ ය. අනිකුත් වගකීම් රුපියල් කෝටි 1.59කින් ද ඉහළ ගියේ ය. මෙසේ ජාත්‍යන්තර සංචිතයේ පහළ වැටීමත් නෝට්ටු හා කාසි සහ ඉල්ලුම් වගකීම් ඉහළ යාමත් නිසා ජාත්‍යන්තර සංචිතයෙහි, නෝට්ටු, කාසි හා ඉල්ලුම් වගකීම් කෙරෙහි අනුපාතය පහළ වැටිණ. 1958 දී මෙය සියයට 73.8ක් වූ අතර 1959 අවසාන වන විට 48.2 දක්වා පහළ බැස තිබිණ.

## (2) වෙළඳ බැංකු

ලංකා බැංකුව විසින් අලුත් බැංකු ශාඛා සතරක් විවෘත කරනු ලැබීමත් සමඟ ම 1959 දී වෙළඳ බැංකු පහසුකම් වැඩි විය. දනට පිහිටුවා ඇති ලංකා බැංකුවේ කාර්යාල 25න් 7 ක් පිහිටුවා ඇත්තේ කොළඹ ය. අවුරුද්ද අවසානයේ දී වෙළඳ බැංකු කාර්යාල 44ක් විය. මෙයින් 18ක් ම කොළඹ පිහිටියේ ය.

අවුරුද්ද අවසානයේ දී, බැංකු කාර්යාල සහ තැන්පතු අයිතිය, දේශීය සහ විදේශීය බැංකු අතර බෙදී ගිය අයුරු පහත සටහනේ දක්වේ.

### සටහන (1—4)

### බැංකු කාර්‍යාල සහ බැංකු තැන්පතු

| මුළු ගණන | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දීය සහ අනිකුත් බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්‍යාල ගණන | තැන්පතු | | කාර්‍යාල ගණන | තැන්පතු | | කාර්‍යාල ගණන | තැන්පතු | | කාර්‍යාල ගණන | තැන්පතු | |
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සිය: ගණ: | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සිය: ගණ: | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සිය: ගණ: | | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සිය: ගණ: |
| 44 | 993 | 100 | 27 | 430 | 43 | 12 | 488 | 49 | 5 | 76 | 8 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහා බැංකුවෙනි

වෙළඳ බැංකු වත්කම් හා වගකීම් ආකෘතිය (සැදුන පිළිවෙළ) දෙවන පරිශිෂ්ටයේ 4 වැනි සටහනේ සවිස්තරව පෙන්වා ඇත. පහත සටහනේ එය ලුහුඬින් දක්වේ.

### සටහන 11—5

### වෙළඳ බැංකු වත්කම් හා වගකීම් සැකසුම

රුපියල් දශ ලක්ෂ

| | 1951 | 1952 | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති කාසි සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ද ඇතුළුව.) | 209 | 177 | 128 | 106 | 149 | 148 | 139 | 119 | 116 |
| විදේශීය මුදල් ශෙෂ .. .. | 171 | 97 | 44 | 55 | 112 | 116 | 72 | 50 | 52 |
| භාණ්ඩාගාර බිල්පත් .. .. | 45 | 39 | 55 | 60 | 51 | 39 | 34 | 16 | 24 |
| වට්ටම් කළ බිල්පත් .. .. | 72 | 64 | 65 | 73 | 94 | 93 | 100 | 116 | 119 |
| මුළු ද්‍රවශීල වත්කම් .. .. | 497 | 377 | 292 | 294 | 406 | 396 | 345 | 301 | 311 |
| මුළු ආයෝජන (1) .. .. | 218 | 235 | 235 | 221 | 245 | 291 | 308 | 296 | 285 |
| මුළු ණය දීම් හා අයිරාවන් .. | 153 | 176 | 182 | 208 | 244 | 273 | 340 | 363 | 395 |
| ඉල්ලුම් තැන්පතු (2) .. | 753 | 653 | 573 | 562 | 675 | 731 | 721 | 661 | 655 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | 83 | 95 | 102 | 126 | 190 | 206 | 240 | 263 | 300 |
| මුළු තැන්පතු .. .. | 848 | 754 | 677 | 689 | 869 | 941 | 965 | 926 | 955 |
| අනුපාතය:— .. .. | % | % | % | % | % | % | % | % | % |
| කාසි: ඉල්ලුම් තැන්පතු .. | 27.8 | 27.1 | 22.3 | 18.9 | 22.1 | 20.2 | 19.3 | 18.0 | 17.7 |
| කාසි: මුළු තැන්පතු .. .. | 24.6 | 23.5 | 18.9 | 15.4 | 17.1 | 15.7 | 14.4 | 12.9 | 12.1 |
| විදේශීය මුදල්: මුළු තැන්පතු .. | 20.2 | 12.9 | 6.5 | 8.0 | 12.9 | 12.3 | 7.5 | 5.4 | 5.4 |
| භාණ්ඩාගාර බිල්පත්: මුළු තැන්පතු | 5.3 | 5.2 | 8.1 | 8.7 | 5.9 | 4.1 | 3.5 | 1.7 | 2.5 |
| වෙළඳ බිල්පත්: මුළු තැන්පතු .. | 8.5 | 8.5 | 9.6 | 10.6 | 10.8 | 9.9 | 10.4 | 12.5 | 12.5 |
| ද්‍රවශීල වත්කම්: ඉල්ලුම් තැන්පතු.. | 66.0 | 57.7 | 50.9 | 52.3 | 60.1 | 54.2 | 47.9 | 45.5 | 47.5 |
| ද්‍රවශීල වත්කම්: මුළු තැන්පතු .. | 58.6 | 50.0 | 43.1 | 42.7 | 46.7 | 42.1 | 35.8 | 32.5 | 32.6 |
| ආයෝජන: මුළු තැන්පතු .. | 25.7 | 31.2 | 34.7 | 32.1 | 28.2 | 30.9 | 31.9 | 32.0 | 29.8 |
| මුළු ණය දීම්: මුළු තැන්පතු .. | 18.0 | 23.3 | 26.9 | 30.2 | 28.1 | 29.0 | 35.2 | 39.2 | 41.4 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) රජයේ හා රජය සහතික කළ ණය පත් සහ මහ බැංකු නිකුතු.

(2) දේශීය අන්තර් බැංකු තැන්පතු හැර.

1959 දී වෙළඳ බැංකුවල මුළු වගකීම් රුපියල් කෝටි 4.46කින් හෙවත් සියයට 4.1කින් රුපියල් කෝටි 113.35ට නැංගේය. 1958 දී සාමාන්‍ය මාසික තැන්පතු ප්‍රමාණය අඩු වුව ද, එය රුපියල් කෝටි 92.6 සිට රුපියල් කෝටි 95.5 දක්වා ඉහළ ගියේ ය. මේ වැඩිවීම ඇතිවූයේ කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතුවල මාසික සාමාන්‍යය 1958 වූ රුපියල් කෝටි 2.63 සිට 1959දී රුපියල්දී කෝටි 30 දක්වා ඉහළ යාමෙනි. එහෙත් ඉල්ලුම් තැන්පතුවල මාසික සාමාන්‍යය මේ කාලය තුලදී රුපියල් කෝටි 66.1 සිට රුපියල් කෝටි 65.5 දක්වා පහළ වැටිණ. 1958 සියයට 28.4ක් ව තුබූ මුළු තැන්පතුව කෙරෙහි වූ කාලීන සහ ඉල්ලුම් තැන්පතු අනුපාතයේ මාසික සාමාන්‍යය 1959 දී සියයට 31.4 දක්වා ඉහළ ගියේ ය. ඉල්ලුම් තැන්පතු අනුපාතය සියයට 71.6න් සියයට 68.6 දක්වා පහළ වැටිණ. 1958 දී රුපියල් කෝටි 3.56 ක් වූ අන්තර් බැංකු ණය ගැනීම් මාසික සාමාන්‍යය 1959 දී රුපියල් කෝටි 3.49 දක්වා මදක් පහළ වැටුණ ද 1959 දී අන්තර් බැංකු ණය ගැනීම් ඉහළ මට්ටමක පැවති බැව් සැළකිය යුතු ය. මෙය 1959 වර්ෂය තුල වූ මුදල් හිඟකම පිළිබිඹු කරයි.

1958 සැප්තැම්බර් සහ 1959 මාර්තු හා සැප්තැම්බර් මාසාවසානයන්හි දී තැන්පතු (රජය සතු සහ අන්තර් බැංකු තැන්පතු හැර) අයිතිව තිබූ අන්දම පහත සටහනේ දැක්වේ. මේ සංඛ්‍යා සකස් කොට ඇත්තේ බැංකු තැන්පතු සහ ණය දීම් පිළිබඳව සහ මහ බැංකුව විසින් කරන අර්ධ වාර්ෂික පරීක්ෂණ අනුවය.

### සටහන (11—6)

### තැන්පතු අයිතිය

ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලිනි.

| | ඉල්ලුම් | | කාලීන | | ඉතිරිකිරීම් | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| මුදල් සංස්ථා | | | | | | | | |
| 1958 සැප්. .. | 44.4 | 8.0 | 45.2 | 35.0 | 4.0 | 3.8 | 93.6 | 11.9 |
| 1959 මාර්තු .. | 37.6 | 6.9 | 46.5 | 28.7 | 4.9 | 4.5 | 89.0 | 10.9 |
| 1959 සැප්. .. | 42.3 | 7.6 | 43.5 | 26.3 | 3.1 | 2.7 | 88.9 | 10.6 |
| වතු | | | | | | | | |
| 1958 සැප්. .. | 133.3 | 24.2 | 16.3 | 12.6 | 1.2 | 1.1 | 150.7 | 19.2 |
| 1959 මාර්තු .. | 134.2 | 24.6 | 25.3 | 15.6 | 1.3 | 1.2 | 160.8 | 19.7 |
| 1959 සැප්. .. | 135.6 | 24.2 | 35.5 | 21.4 | 1.0 | 0.9 | 172.1 | 20.5 |
| වෙළඳ ව්‍යාපාර | | | | | | | | |
| 1958 සැප්. .. | 51.9 | 9.3 | 7.0 | 5.4 | 0.6 | 0.6 | 59.5 | 7.6 |
| 1959 මාර්තු .. | 54.3 | 10.0 | 9.2 | 5.7 | 0.2 | 0.2 | 63.8 | 7.8 |
| 1959 සැප්. .. | 60.5 | 10.8 | 9.1 | 5.5 | 0.3 | 0.3 | 69.8 | 8.3 |
| අනිකුත් ව්‍යාපාර | | | | | | | | |
| 1958 සැප්. .. | 65.4 | 11.8 | 19.1 | 14.8 | 0.9 | 0.8 | 85.4 | 10.9 |
| 1959 මාර්තු .. | 68.6 | 12.6 | 23.9 | 14.7 | 0.7 | 0.6 | 93.3 | 11.4 |
| 1959 සැප්. .. | 65.1 | 11.6 | 26.4 | 15.9 | 1.0 | 0.9 | 92.5 | 11.0 |
| පළාත් පාලන මණ්ඩල | | | | | | | | |
| 1958 සැප්. .. | 17.7 | 3.2 | 10.0 | 7.7 | 0.5 | 0.5 | 28.1 | 3.6 |
| 1959 මාර්තු .. | 17.2 | 3.2 | 16.0 | 9.9 | 0.2 | 0.2 | 33.4 | 4.1 |
| 1959 සැප්. .. | 12.2 | 2.2 | 10.1 | 6.1 | 0.1 | ... | 22.5 | 2.7 |
| වෙළඳ නොවන සංස්ථා | | | | | | | | |
| 1958 සැප්. .. | 27.4 | 5.0 | 1.9 | 1.5 | 1.9 | 1.8 | 31.1 | 4.0 |
| 1959 මාර්තු .. | 23.7 | 4.3 | 6.5 | 4.0 | 2.7 | 2.5 | 32.8 | 4.0 |
| 1959 සැප්. .. | 25.5 | 4.6 | 5.5 | 3.3 | 2.5 | 2.2 | 33.5 | 4.0 |
| පුද්ගලයෝ | | | | | | | | |
| 1958 සැප්. .. | 211.8 | 38.4 | 29.7 | 23.0 | 95.4 | 91.4 | 336.9 | 42.9 |
| 1959 මාර්තු .. | 210.0 | 38.5 | 34.7 | 21.4 | 98.8 | 90.8 | 343.5 | 42.1 |
| 1959 සැප්. .. | 218.9 | 39.0 | 35.4 | 21.4 | 107.3 | 93.1 | 361.6 | 43.0 |
| එකතුව | | | | | | | | |
| 1958 සැප්. .. | 551.9 | 100.0 | 129.2 | 100.0 | 104.4 | 100.0 | 785.5 | 100.0 |
| 1959 මාර්තු .. | 545.7 | 100.0 | 162.1 | 100.0 | 108.8 | 100.0 | 816.5 | 100.0 |
| 1959 සැප්. .. | 560.1 | 100.0 | 165.6 | 100.0 | 115.3 | 100.0 | 841.0 | 100.0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහා බැංකුවෙනි

වතු, වෙළඳ ව්‍යාපාර, අනිකුත් ව්‍යාපාර, වෙළඳ නොවන සංස්ථා සහ පුද්ගලයන් සතු තැන්පතු ඉහළ ගිය අතර මුදල් සංස්ථාවන් සහ පළාත් පාලන සතු තැන්පතු පහළ වැටිණ. 1959 සැප්තැම්බරයේ දී මුළු බැංකු තැන්පතු ප්‍රමාණයෙන් සියයට 43ක් පුද්ගලයන්ට ද, සියයට 21ක් වතුවලට ද, සියයට 11ක් අනිකුත් ව්‍යාපාරයන්ට ද, සියයට 11ක් මුදල් සංස්ථාවන්ට ද, සියයට 8ක් වෙළඳ සංස්ථාවන්ට ද, සියයට 4ක් වෙළඳ නොවන සංස්ථාවන්ට ද, සියයට 3ක් පළාත් පාලන මණ්ඩලයන්ට ද අයිති විය.

ඉහළ සටහනේ පෙන්වා ඇති පරිදි 1959 සැප්තැම්බර් මාසයෙන් අවසාන වූ අවුරුද්ද තුල කාලීන තැන්පතු රුපියල් කෝටි 3.64කින් ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ තේ වතු සතු තැන්පතු රුපියල් කෝටි 1.92කින් වැඩිවීමය. අනිකුත් වෙළඳ ව්‍යාපාර ප්‍රධාන වශයෙන් රාජ්‍ය සමායතන කීපයක සහ පුද්ගලයන් සතු තැන්පතු රුපියල් කෝටි 0·73කින් සහ රුපියල් කෝටි 0.57කින් පිළිවෙළින් වැඩි විය. රුපියල් කෝටි 1.09කින් ඉතිරි කිරීම් තැන්පතුවල ඉහළ නැගීම සිදු වූයේ මුළුමනින් ම වාගේ පෞද්ගලික ඉතිරි කිරීම් තැන්පතුවලිනි. මුළු ඉතිරිකිරීම් තැන්පතුවලින් සියයට 93ක් පමණ පුද්ගලයින් සතු තැන්පතු විය. ඉල්ලුම් තැන්පතුවල ඇති වූ රුපියල් කෝටි 0.82ක සුළු වැඩිවීම වැඩි වශයෙන් ම වෙළඳ ව්‍යාපාරික හා පුද්ගලික තැන්පතු සම්බන්ධව විය. රටෙහි පැවති නොසන්සුන් තත්වය නිසා, නොබෙදූ ලාභ ව්‍යාපාර දියුණුව සඳහා නොයොද මුදල් වශයෙන් තබා ගැනීම, තේ වතු සතු කාලීන තැන්පතු ඉහළ යාමේ හේතුව යයි සැළකිය හැක. රජයේ සමායතනයන්ගේ කාලීන තැන්පතු වැඩි වූයේ රජයෙන් ලබා ගත් මුදල්, වැය කිරීමට පෙර තාවකාලිකව එසේ තබා ගැනීම නිසා විය හැක.

1959 තුල මුදල් වෙළඳ පොල වැඩි වශයෙන් හිඟ තත්වයක පැවතෙමින් තිබිණ. මෙය ජාත්‍යන්තර ගනුදෙනු තත්වය තව දුරටත් අවාසි අතට හැරීමත්, පෞද්ගලික ව්‍යාපාර අංශයේ බැංකු ණය සඳහා ඉල්ලුම් වැඩි වීමත් නිසා සිදු වූවකි. නමුත් මුදල් වෙළඳ පොලේ තත්වය 1958 වර්ෂයේ දී තරම් හිඟ සහිත නොවීය. මෙය ප්‍රධාන වශයෙන් ම රජයේ අයවැය හිඟය පියවීමට මුදල් යෙදවීමෙන් වූ ප්‍රසාරණාත්මක බලපෑම නිසා සිදු වූවකි.

වෙළඳ බැංකුවල කාසි සංචිත මට්ටම පහත් තත්වයක තුබුණ ද එහි ද්‍රවශීලතාව 1958 දීට වඩා සතුටුදයක විය. මහ බැංකුව වෙත වූ සංචිත අඩුවුව ද, වෙළඳ බැංකු ඔවුන්ගේ සුරක්ෂිතාගාරවල තබා ගත් මුදල් ප්‍රමාණය වැඩි විය. ඔවුහු භාණ්ඩාගාර සහ වෙළඳ බිල්පත් පෙරට වඩා මිල දී ගත්හ. 1958 වේ රුපියල් කෝටි 3.0ක් වූ අතැති මුදලේ මාසික සාමාන්‍යය 1959 දී කෝටි 3.2ක දක්වා ඉහළ ගියේය. විදේශීය මුදල්හි මාසික සාමාන්‍යය රුපියල් කෝටි 5.0 සිට 5.2 දක්වා වැඩි විය. මහ බැංකුව වෙත වූ සංචිතයන්හි මාසික සාමාන්‍යය රුපියල් කෝටි 8.9 සිට 8.5 දක්වා පහත වැටිණ. මුළු කාසි සංචිතයන්හි හා විදේශ මුදල්හි මාසික සාමාන්‍යය 1959 දී ද 1958 මට්ටමේ ම පැවැත්තේ ය. එහෙත් තැන්පතුවල වැඩිවීමේ හේතුවෙන් කාසි සංචිත සහ විදේශීය මුදල්හි මුළු තැන්පතුව කෙරෙහි 1958 දී සියයට 18.3 ක් වූ මාසික සාමාන්‍ය අනුපාතය 1959 දී සියයට 17.5 දක්වා මඳ වශයෙන් පහත බැස්සේය.

1959 වර්ෂයේ වැඩි කාලයක් තුල ම සමහර වෙළඳ බැංකු, මහ බැංකුව වෙත තැන්පත් කොට තිබූ කාසි ශෙෂය, 'අවශ්‍ය සංචිත' මට්ටම ඉක්ම වූයේ නැත. 1958 දී රුපියල් කෝටි 1.0ක් වූ වෙළඳ බැංකුවල අධි සංචිතයන් ගේ මාසික සාමාන්‍යය 1959 දී රුපියල් කෝටි 0.5 දක්වා පහළ ගිය අතර වෙළඳ බැංකු බොහෝ ගණනකට අඩු වූ කාසි ශෙෂ පූරණය සඳහා මහ බැංකුවෙන් ණයට ගැනීමට සිදු විය. එසේ වුව ද, ඔවුන් මෙසේ ණයට ගත් ප්‍රමාණය 1958 දීට වඩා අඩු විය.

ඔවුන්ගේ ඉතිරි ද්‍රවශීල වත්කම් අතරින් 1959 දී භාණ්ඩාගාර බිල්පත්හි සාමාන්‍ය අයිතිය රුපියල් කෝටි 0.8කින් ද, වෙළඳ බිල්පත්හි සාමාන්‍ය අයිතිය කෝටි 0.3 කින් ද ඉහළ ගියේ ය. 1958 දී බැංකු වෙත වූ භාණ්ඩාගාර බිල්පත් අයිතියේ මාසික සාමාන්‍යය රුපියල් කෝටි 1.8 කින් පහළ වැටිණ. ඔවුන් වෙත වූ බිල්පත් කල් පිරීමේ දී, අළුත් බිල්පත් මිල දී ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. 1959 දී ඔවුන් වෙත භාණ්ඩාගාර බිල්පත් ඉහළ යාම, තත්වයේ දියුණුවක් පෙන්නුම් කරයි. මුළු තැන්පතු කෙරෙහි සියලු ද්‍රවශීල වත්කම්හි මාසික සාමාන්‍ය අනුපාතය 1959 දී 1958 දී ගණනට සමාන ව ම පැවැත්තේ ය. මෙය සියයට 32.6ක් විය.

වෙළඳ බැංකු ණය දීම් ද 1958 මාසික සාමාන්‍යය වූ රුපියල් කෝටි 3.63 සිට 1959 දී රුපියල් කෝටි 39.5 දක්වා ඉහළ ගියේ ය. මුළු තැන්පතු කෙරෙහි මේවායේ අනුපාතය සියයට 39.2 සිට 41.4 දක්වා වැඩි විය. රජයේ ණය පත් ආයෝජනයෙහි මාසික සාමාන්‍යය 1958 දී රුපියල් කෝටි 2·96 ක් වුවද 1959 දී කෝටි 2·85 කට අඩු විය. මුළු තැන්පතු කෙරෙහි අනුපාතය සියයට 32 සිට සියයට 29.8 දක්වා පහත වැටිණ. නමුත් 1958 අවසාන මාස 5 හේ වූ මට්ටමට වඩා 1959 යේ මට්ටමෙහි වූයේ ඉතා සුළු අඩුවකි. 1959 දී මේ ආයෝජන පහළ වැටුනේ ද ඉතා සුළු වශයෙනි. එය ද රුපියල් කෝටි 0.17ක් පමණෙකි. පෙර අවුරුද්දේ මෙන් පෞද්ගලික අංශයේ ණය ඉල්ලීම් පිරිමැසීම සඳහා රජයේ ණය පත් විකිණීමට ද ඔවුන්ට සිදු වූයේ නැත.

1958 සැප්තැම්බර්, 1959 මාර්තු සහ සැප්තැම්බර් අවසානයන්හි දක්වා පෞද්ගලික අංශයට දී ඇති වෙළඳ බැංකු ණය, කාර්යයන් අනුව පහත සටහනේ දැක්වේ.

### සංඛ්‍යා සටහන II—7

### වෙළඳ බැංකු ණයදීම් — කාර්යයන් හා කාල සීමා අනුව

| කාර්යයන් | | | කෙටි කාලීන (හය මසකට අඩු) | | මධ්‍යම කාලීන (6 මාසයේ සිට 30 මස දක්වා) | | දීර්ඝ කාලීන (මාස 30කට වැඩි) | | මුළු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (1) | 1–7න් සියයට ගණන වශයෙ: (2) | (3) | 3–7න් සියයට ගණන වශයෙ; (4) | (5) | 5–7න් සියයට ගණන වශයෙ; (6) | (7) | 7–එකතු සියයට ගණන වශයෙ: (8) |
| (අ) වෙළඳ | සැප්. | 1958 .. | 165.1 | 44.6 | 148.8 | 40.2 | 56.3 | 15.2 | 370.1 | 72.8 |
| | මාර්තු | 1959 .. | 169.1 | 45.7 | 147.6 | 39.9 | 53.6 | 14.5 | 370.3 | 71.9 |
| | සැප්. | 1959 .. | 166.9 | 44.0 | 151.3 | 39.9 | 61.4 | 16.2 | 379.6 | 71.9 |
| (ආ) මූල්‍ය | සැප්. | 1958 .. | 21.8 | 34.1 | 18.4 | 28.8 | 23.7 | 37.1 | 63.9 | 12.6 |
| | මාර්තු | 1959 .. | 23.9 | 32.5 | 23.6 | 32.1 | 26.1 | 35.5 | 73.6 | 14.3 |
| | සැප්. | 1959 .. | 23.7 | 31.2 | 24.2 | 31.8 | 28.0 | 36.8 | 76.0 | 14.4 |
| (ඇ) කෘෂිකාර්මික | සැප්. | 1958 .. | 2.2 | 17.1 | 9.1 | 70.5 | 1.6 | 12.4 | 12.9 | 2.5 |
| | මාර්තු | 1959 .. | 3.5 | 31.5 | 5.7 | 51.4 | 2.0 | 18.0 | 11.1 | 2.2 |
| | සැප්. | 1959 .. | 3.1 | 30.1 | 5.0 | 48.5 | 2.2 | 21.4 | 10.3 | 2.0 |
| (ඈ) කාර්මික | සැප්. | 1958 .. | 2.8 | 11.4 | 17.0 | 69.4 | 4.7 | 19.2 | 24.5 | 4.8 |
| | මාර්තු | 1959 .. | 4.3 | 17.3 | 16.4 | 65.9 | 4.3 | 17.3 | 24.9 | 4.8 |
| | සැප්. | 1959 .. | 4.6 | 18.9 | 15.6 | 64.2 | 4.0 | 16.5 | 24.3 | 4.6 |
| (ඉ) පාරිභෝජනය | සැප්. | 1958 .. | 8.5 | 33.1 | 12.8 | 49.8 | 4.4 | 17.1 | 25.7 | 5.1 |
| | මාර්තු | 1959 .. | 7.4 | 28.9 | 13.7 | 53.5 | 4.5 | 17.6 | 25.6 | 5.0 |
| | සැප්. | 1959 .. | 9.5 | 30.6 | 16.3 | 52.6 | 5.2 | 16.8 | 31.0 | 5.9 |
| (ඊ) අනිකුත් | සැප්. | 1958 .. | 1.8 | 16.5 | 6.4 | 58.7 | 2.7 | 24.8 | 10.9 | 2.1 |
| | මාර්තු | 1959 .. | 3.1 | 32.0 | 4.7 | 48.5 | 1.9 | 19.6 | 9.7 | 1.9 |
| | සැප්. | 1959 .. | 1.2 | 17.9 | 4.4 | 65.7 | 1.1 | 16.4 | 6.7 | 1.3 |
| මුළු ගණන | සැප්. | 1958 .. | 202.2 | 39.8 | 212.6 | 41.8 | 93.4 | 18.4 | 508.2 | 100.0 |
| | මාර්තු | 1959 .. | 211.3 | 41.0 | 211.7 | 41.1 | 92.3 | 17.9 | 515.3 | 100.0 |
| | සැප්. | 1959 .. | 209.0 | 39.6 | 216.8 | 41.0 | 102.0 | 19.3 | 527.9 | 100.0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* අයිරාවන් හා වෙළඳ බිල්පත් මිලයට ගැනීම් ද, ණය දීම්වලට ඇතුලත්ය.

ඉහළ සටහනේ පෙන්වා ඇති පරිදි 1959 යේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වූ වර්ෂයේ බැංකු ණය ඉහළ ගියේ ප්‍රධාන වශයෙන් මූල්‍ය, වෙළඳ සහ පාරිභෝජන කාර්යයන් නිසාය. රුපියල් කෝටි 1.21කින් ඉහළ ගිය මූල්‍ය කාර්යයන් සඳහා ණය දීම්, කුලී පිට ගැනුම් කරන වෙළඳ සමාගම්වලට සහ සමාගම් කොටස් මිලට ගැනීමට දුන් ණයවලින් සමන්විත වේ. වෙළඳ කාර්යයන් සඳහා දුන් මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 0.95කින් ඉහළ ගිය ද, වෙළඳ ණය දීම් පදනම් කොට වූ හුවමාරු භාණ්ඩවල ස්වභාවයේ සැළකිය යුතු වෙනස්වීමක් විය.

1 59 දී ආයතනයන්ගේ සැළකිය යුතු ඉහළ යාමක් පිළිබිඹු කරමින් ආයාත වෙළඳාම සඳහා න් ණය රුපියල් කෝටි 1.93කින් ඉහළ ගියේ ය. එහෙත් මේ කාලය තුල නිර්යාතයන්ගේ වටිනාකම ඉහළ ගිය ද නිර්යාතයන් උදෙසා දුන් ණය රුපියල් කෝටි 0.84කින් අඩු විය. රුපියල් කෝටි 0.53කින් වැඩි වූ පාරිභෝජන ණය දීම්වලින්, රුපියල් කෝටි 0.17ක් කල් පවතින පාරිභෝජන භාණ්ඩ සඳහා ද, රුපියල් කෝටි 0.36ක් පාරිභෝජන කටයුතු සඳහා ද විය.

පසුගිය වර්ෂයේ මෙන් ම බැංකු ණය දීම් වැඩි කොටසක් වෙළඳාම සඳහා විය. 1959 සැප්තැම්බර් මාසයේ දී වෙළඳාම සඳහා දී තිබූ බැංකු-ණය සියයට 72ක් විය. මූල්‍ය කටයුතු සඳහා සියයට 14ක් ද, පාරිභෝජනය සඳහා සියයට 6ක් ද කාර්මික කටයුතු සඳහා සියයට 5ක් ද, කෘෂිකාර්මික කටයුතු සඳහා සියයට 2ක් ද, ණය දී තිබුණි.

බැංකු ණය වැඩි වශයෙන් ම දෙන ලද්දේ වෙළඳ බඩු තොග, ලේඛන ගත බිල්පත් සහ නිශ්චල දේපල ඇප වශයෙන් තබා ගෙනය. බැංකු ණය දීම් සඳහා ඇප වශයෙන් තිබූ දැ පහත දැක්වේ.

### සටහන (11—8)

### බැංකු ණය — ඇප වර්ග

| ඇප වර්ග | 1958 සැප්තැම්බර් 30 වැනිද | | 1959 මාර්තු 31 වැනිද | | 1959 සැප්තැම්බර් 30 වැනිද | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සියයට ප්‍රමාණය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සියයට ප්‍රමාණය | ප්‍රමාණය රු. දශ ලක්ෂ | සියයට ගණන |
| ලේඛන ගත බිල්පත් .. .. | 133.7 | 26.3 | 138.1 | 26.8 | 137.0 | 26.0 |
| රජයේ ණය පත් .. .. | 4.1 | 0.8 | 5.7 | 1.1 | 10.7 | 2.0 |
| වෙළඳ සමාගම්වල කොටස් .. | 41.5 | 8.2 | 35.9 | 7.0 | 33.0 | 6.3 |
| ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් වටිනාකම ඇතුළුව කාලීන සහ ඉතිරි කිරීම් තැන්පතු සහ අනිකුත් මුදල් තැන්පතු.. | 12.3 | 2.4 | 16.8 | 3.3 | 13.0 | 2.5 |
| වෙළඳ තොග .. .. .. | 158.1 | 31.1 | 168.7 | 32.7 | 178.2 | 33.8 |
| නිශ්චල දේපොල.. .. .. | 61.8 | 12.2 | 60.5 | 11.7 | 61.3 | 11.6 |
| වෙනත් .. .. .. | 40.4 | 7.9 | 52.0 | 10.1 | 63.5 | 12.0 |
| ඇප රහිත.. .. .. .. | 56.3 | 11.1 | 37.5 | 7.3 | 31.0 | 5.9 |
| මුළු ගණන .. | 508.2 | 100.0 | 515.1 | 100.0 | 527.8 | 100.0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1959 සැප්තැම්බර් මාසයෙන් අවසාන වූ වර්ෂය තුල දී රජයේ බිල්පත් උදෙසා දුන් ණය මුදල රුපියල් කෝටි 0.66කින් ද, ලේඛනගත බිල්පත් සඳහා දුන් ණය මුදල රුපියල් කෝටි 0.33 කින් ද වෙළඳ තොග සඳහා දුන් ණය මුදල රුපියල් කෝටි 2.01කින් ද වැඩි විය. වෙළඳ සමාගම් කොටස් ඇපයට ගෙන දෙන ලද ණය රුපියල් කෝටි 0.85 කින් ද, ඇප රහිතව දෙන ලද ණය රුපියල් කෝටි 2.53කින් ද පහත බැස්සේය. පොරොන්දු නෝට්ටු සහ ඔප්පු ඇප වශයෙන් තබා ගෙන, වැඩියෙන් ම වී වෙළඳාම සඳහා සමුපකාර සමිතිවලට දුන් ණය හා මාස්පතා ගෙවීම් කුවිතාන්සිවලට දුන් ණය රුපියල් කෝටි 2.31කින් ඉහළ ගියේ ය.

බැංකු ණය දීම්, පොලී ප්‍රමාණය අනුව වර්ග කොට පහත සටහනේ දැක්වේ.

### සටහන (11—9)

### බැ-කු ණය දීම — පොලී ප්‍රමාණය අනුව

| පොලිය (සි[illegible]ට ගණන) | 1958 සැප්. 30 වැනිද | | 1959 මාර්තු 31 වැනිද | | 1959 සැප්. 31 වැනිද | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු.දශලක්. | සියයට ප්‍රමාණය | ප්‍රමාණය රු.දශලක්. | සියයට ප්‍රමාණය | ප්‍රමාණය රු.දශලක්. | සියයට ප්‍රමාණය |
| 2½ පහත .. .. .. | 1.6 | 0.4 | 1.5 | 0.3 | 1.3 | 0.3 |
| 2½ .. .. .. | 1.0 | 0.2 | 0.3 | 0.1 | 0.1 | ... |
| 3 .. .. .. | 8.2 | 1.9 | 3.7 | 0.8 | 10.1 | 2.2 |
| 3½ .. .. .. | 3.2 | 0.7 | 8.4 | 1.9 | 13.2 | 2.9 |
| 4 .. .. .. | 12.4 | 2.9 | 14.3 | 3.2 | 8.1 | 1.8 |
| 4½ .. .. .. | 171.8 | 39.8 | 181.0 | 40.5 | 187.4 | 41.1 |
| 5 .. .. .. | 60.7 | 14.1 | 102.1 | 22.8 | 96.6 | 21.2 |
| 5½ .. .. .. | 31.5 | 7.3 | 28.1 | 6.3 | 33.6 | 7.4 |
| 6 .. .. .. | 120.8 | 28.0 | 91.4 | 20.4 | 90.3 | 19.8 |
| 6½ .. .. .. | 13.1 | 3.0 | 9.4 | 2.1 | 7.7 | 1.7 |
| 7 .. .. .. | 2.5 | 0.6 | 2.6 | 0.6 | 3.3 | 0.7 |
| 7½ .. .. .. | 2.2 | 0.5 | 2.2 | 0.5 | 2.3 | 0.5 |
| 8 සහ ඉන් ඉහළ .. .. | 2.9 | 0.7 | 2.2 | 0.4 | 2.3 | 0.5 |
| එකතුට .. | 431.8 | 100.0 | 447.3 | 100.0 | 456.1 | 100.0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙ

* දැනට පවත්නා විනිමය අනුපාතිකය අනුව මිලයට ගත් නිර්යාත බිල්පත් හැර.

ඉහළ සටහනේ පෙන්වා ඇති පරිදි ණය දීම්වලින් සියයට 90ක් ම දී ඇත්තේ සියයට $4\frac{1}{2}$ සිට 6 දක්වා වූ පොලී ප්‍රමාණයන් අනුවය. මේ කාලය තුල සියයට $4.\frac{1}{2}$ පොලියට දෙන ලද ණය කෝටි 1.56 කින් සහ සියයට 5හේ පොලියට දෙන ලද ණය රුපියල් කෝටි 3.59කින් ද ඉහළ ගිය අතර සියයට 6යේ පොලියට දෙන ලද ණය, රුපියල් කෝටි 3.05කින් පහත බැස්සේය.

අන්තර් බැංකු ණය ගැනීම් වැඩිවීම නිසා අන්තර් බැංකු ඒක්ෂණ ණය පොලිය 1959 මැයි මාසයේ දී සියයට $1\frac{1}{4}$ සිට සියයට $1\frac{1}{2}$ දක්වා ඉහළ නැඟ එයින් පසු ඒ මට්ටමේම පැවැත්තේ ය. දෙසැම්බර් මාසයේ කිහිප දිනක් පමණක් පැවතුන මහ බැංකු පොලී ප්‍රමාණයේ ඉහළ යාම නිසා වෙළඳ බැංකුවල සමහර පොලී තාවකාලිකව වැඩි වුව ද වෙළඳ බැංකුවල අනිකුත් ණය පොලී ප්‍රමාණයන්හි වෙනසක් ඇති නොවීය. භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය පොලිය 1958 දෙසැම්බර් මාසයේ දී සියයට 1.76ක්ව තිබුන ද 1959 ජූනි මාසයේ දී සියයට 2. දක්වා ඉහළ නැඟ එම මට්ටමේ ම නොවැම්බර් මාසය දක්වා පැවතුණි. නමුත් දෙසැම්බර් මාසයේ දී යලි එය සියයට 2.03 දක්වා ඉහළ නැංගේය. භාණ්ඩාගාර බිල්පත් පොලියෙහි ඉහළ යාම මුදල් දුෂ්කර අවස්ථාවන්හි භාණ්ඩාගාර බිල්පත්වලින් ණය ගැනීම වැඩි වීම පිළිබිඹු කරයි.

1958 දී රුපියල් කෝටි 66.14කට පහත වැටුන බැංකු නිෂ්කාශනයන්හි මාසික සාමාන්‍යය 1959 දී රුපියල් කෝටි 71.38 දක්වා ඉහළ ගියේ ය.

**අනිකුත් මුදල් ආයතන.**

1959 දී ප්‍රධාන ඉතිරිකිරීම් ආයතනවල, ඉතිරිකිරීම් සාමාන්‍යයෙන් වැඩි විය. රුපියල් කෝටි 3.48කින් වැඩි වූ වෙළඳ බැංකුවල කාලීන සහ ඉතිරිකිරීම් තැන්පතු හැර, තැපැල් කන්තෝරු සේවිංග්ස් බැංකුව, ලංකා සේවින්ග්ස් බැංකුව සහ ඉතිරි කිරීම් සහතික මගින් කරන ලද ඉතිරිකිරීම්, අතිශයින් ඉහළ නැඟෙමින් කෝටි 1.94ට වැඩි විය. 1958 දී මෙය ඉහළ ගියේ රුපියල් කෝටි 1.39කිනි. පසුගිය අවුරුදුවල මෙන් ම ප්‍රධාන වශයෙන් ම ඉතිරිකිරීම් වැඩි වූයේ තැපැල් කන්තෝරු සේවිංග්ස් බැංකු තැන්පතුවලය. සියලු ආයතනවල ම මුළු ඉතිරි කිරීම් ප්‍රමාණය වැඩි වූයේ කෝටි 5.24කිනි. 1959 දී පහත සටහනේ දක්වා ඇති පරිදි එය රුපියල් කෝටි 5.42 කින් ඉහළ ගියේ ය.

**සටහන II—10**

**ඉතිරිකිරීමේ තැන්පතු සහ ඉතිරිකිරීමේ සහතික**

| | 1958 අවසානයේදී | 1959 අවසානයේ දී | වෙනස |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු සේවිංස් බැංකුව .. .. | 293.8 | 310.4* | +16.4 |
| ලංකා සේවිංස් බැංකුව .. .. .. | 70.1 | 71.5* | + 1.4 |
| වෙළඳ බැංකු (කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු) .. | 284.6 | 319.4 | +34.8 |
| ඉතිරිකිරීම් සහතික (නොගෙවූ) .. .. .. | 29.7 | 31.1* | + 1.4 |
| එකතුව .. | 678.2 | 732.4* | +54.2 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

තාවකාලිකයි.

මේ සමඟ ම 1959 සිට ක්‍රියාත්මක වූ සේවක අර්ථ සාධක අරමුදලට, අවුරුද්ද අවසාන වන විට රුපියල් කෝටි 1.19ක් එකතු වී තිබිණ.

දීර්ඝ කාලීන ණය දෙන ආයතන අතුරෙන්, රජයේ උකස් බැංකුව විසින් කෘෂිකර්ම සහ ගොඩනැගිලි කටයුතු සඳහා 1957–58 මුදල් වර්ෂයේ දෙන ලද ණය රුපියල් කෝටි 0.95 සිට 1958–59 මුදල් වර්ෂයේ දී රුපියල් කෝටි 0.86 දක්වා පහළ වැටිණ. නමුත් මේ කාලය තුල ණය ගත් අයගේ සංඛ්‍යාව 373 සිට 388 දක්වා ඉහළ ගියේය. එසේ වුව ද, 1957/58 හා 1958/59 යන කාලය තුල දී නොගෙවූ ණය ප්‍රමාණය කෝටි 4.28 සිට 4.84 දක්වා වැඩි විය. සංවර්ධන කටයුතු හැර අනෙකුත් කටයුතු සඳහා දෙනු ලබන ඉතාම වැඩි ණය ප්‍රමාණය රුපියල් 1,00,000කි. 1958/59 දී දෙන ලද ණය ප්‍රමාණයේ පහත වැටීමට හේතු වූයේ ගිය අවුරුද්දේ මෙන් ම මේ අවුරුද්දේ ද දෙන ලද ණය ප්‍රමාණයේ උපරිම සීමාවක් මෙසේ නියම කිරීම නිසාය. 1958/59 යේ දී බැංකුවෙන් නිකුත් කළ ණයකරයන්ගේ වටිනාකම රුපියල් කෝටි 0.7ක් විය. 1959 අග දී බැංකුව එහි ණය පොලී ප්‍රමාණය සියයට $4\frac{1}{2}$ සිට 5 දක්වා වැඩි කළේය. 1959 දෙසැම්බර් 22 වැනිදට පසුව අනුමත කරන ලද ණයවලට, මේ අලුත් පොලිය අය කරන ලදී.

* දෙසැම්බර් 28 වනද සිට, අනිකුත් ප්‍රධාන බැංකුවල පොලී ප්‍රමාණයන්ට සමානවන පරිදි, ලංකා 'බැංකුව' ස්ථාවර තැන්පතු සඳහා, එහි පොලී ප්‍රමාණය වැඩිකළේය.

කෘෂිකර්ම–කාර්මික ණය දෙන ආයතනය දුන් ණය 1957/58 හා 1958/59 යන කාලය තුල රුපියල් කෝටි 0.36 සිට කෝටි 0.45 දක්වා ඉහළ ගියේ ය. 1958/59 දී දුන් ණය ප්‍රමාණයෙන් රුපියල් කෝටි 0.11 ක් කර්මාන්ත සඳහා හා කෝටි 0.34ක් කෘෂිකර්මය සඳහා ද විය. මේ කාලය තුල නොබේරූ ණය ප්‍රමාණය රුපියල් කෝටි 3.02 සිට කෝටි 3.09 දක්වා ඉහළ ගියේය.

සංවර්ධන මුදල් සමායතනය මගින් අලුත් කෘෂිකර්ම සහ කාර්මික ව්‍යාපාරයන් සඳහා ණය දීමේ කොටස් ගැනීම්වලින් දෙන ලද ආධාර 1958 දී කෝටි 0.39කින් වැඩි වූ අතර 1959 දී රුපියල් කෝටි 0.42 කින් වැඩි විය. 1959 අවසාන වන විට මෙසේ කෝටි 1.39ක් දී තිබුණේය. ඒ මුදල් ව්‍යාපාර 33ක් සඳහා ලබා ගන්නා ලදි. 1958 දී, දී තිබුණ මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 0.97ක් වූ අතර, එසේ මුදල් ලබා ගත් ව්‍යාපාර 22ක් විය.

ලංකා සේවින්ග්ස් බැංකුවේ 1959 වර්ෂයේ ණය ගනුදෙනු පිළිබඳ සංඛ්‍යා තොරතුරු තවම ලැබී නැත. 1957 දී දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 0.9ක් වූ අතර 1958 දී එය රුපියල් කෝටි 0.95ක් විය.

පෞද්ගලික පාරිභෝජනය සඳහා දෙන ලද ණය, පසුගිය කාලයේ දී වැඩි වී තිබෙන නිසා, මහ බැංකුව විසින් කුලී පිට ගැනුම් ක්‍රමය අනුව ණය දෙන ව්‍යාපාර පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කළේය. මෙ වැනි ණය දෙන ව්‍යාපාර 45ක් පමණ ඇති බැව් එයින් හෙළි විය. මෙයින් 18ක් පමණ වෙනත් සමාගම්හි ආයාත විකිණීම සඳහා ණය මුදල් සපයන මුදල් සමාගම්ය. ඉතිරි ව්‍යාපාර තමන් විසින් නිෂ්පාදන කරන හෝ පිට රටින් ගෙනෙන බඩු විකිණීම සඳහා ණය මුදල් දෙන සිල්ලර වෙළෙන්දෝය. ප්‍රධාන මුදල් සමාගම්, වැඩි වශයෙන් ම මෝටර් රථ මිලයට ගැනීමට පාරිභෝජකයාට මුදල් සපයන බව පෙනේ. ප්‍රධාන සමාගම් හතරක් යන්ත්‍ර උපකරණ සහ ට්‍රැක්ටර් යනාදිය ඇතුලත් ප්‍රාග් ධන භාණ්ඩ විකිණීම සඳහා මුදල් සපයයි. තවත් සමාගම් තුනක් දැනට ගෘහ භාණ්ඩ සඳහා මුදල් සපයයි. තවද, ගුවන් විදුලි යන්ත්‍ර, මහන මැෂින් සහ ශීතකරණ ආදි පාරිභෝජන භාණ්ඩ සඳහා ද මේ ව්‍යාපාරයෝ මුදල් ණයට දෙත්.

කුලී පිට ගැනුම් කොන්දේසි, සමාගම අනුව සහ භාණ්ඩ අනුව ද වෙනස් වෙයි. රථවාහන සඳහා එහි වටිනාකමෙන් සියයට 33⅓ සිට සියයට 50 දක්වා පාරිභෝජකයා විසින් මුල් මුදලක් ගෙවීම අවශ්‍යයි. නමුත් ගුවන් විදුලි යන්ත්‍ර වැනි භාණ්ඩ සඳහා සියයට 25ක ගෙවීමක් ප්‍රමාණවත් වෙයි. මුදල් සමාගම් වලට එම හිඟ මුදල මාස 12කින් හෝ 18කින් මුළුමනින් ම ආපසු ගෙවිය යුතු යි. නමුත් එක සමාගමක් පමණක් මාස 36කින් ගෙවීමට ඉඩ සලසා තිබේ. පාරිභෝජකයා විසින් ගෙවිය යුතු වාර මුදලට පොලියක් ද ඇතුලත් වෙයි. මේ පොලිය ප්‍රාථමිකව සියයට 10ක් වෙයි. නමුත් ගිවිසුම් කාල සීමාව තුල වූ සාමාන්‍ය ණය මුදල හා සලකා බලන විට මේ පොලිය වැඩි වෙයි. එනම් මාස 12කට සියයට 18.5ක් වන අතර, මාස 36කට සියයට 19.5 ක් පමණ වෙයි. සමාගම්වල අරමුදල් සමන්විත වනුයේ, ඔවුන්ගේ ප්‍රාග් ධන හා බැංකු ණය ගැනුම් වලිනි. සමාගම් එකක, දෙකක ස්ථිර තැන්පතු ද අඩංගු වෙයි. ලංකාවේ කුලී පිට ගැනුම් වෙළඳාම් පරිමාව හෝ ඒ සඳහා යොද ඇති ප්‍රාග් ධන ප්‍රමාණය ගැන විස්තරයක් කිරීමට, සමාගම්වල සංඛ්‍යා තොරතුරු තවම නොලැබී ඇති හෙයින් අපහසුය.

1959 දී මහ බැංකුව විසින්, මුදල් ඉතිරිකිරීමේ මාධ්‍යයක් වශයෙන් වැදගත් තැනක් උසුලන රක්ෂණ ව්‍යාපාර ගැන පරීක්ෂණයක් කරන ලදි. මේ පරීක්ෂණයේ ප්‍රතිඵල තවම ලැබී නැත.

1958 වාර්ෂික වාර්තාවෙන් ගැමි ජනතාවෙන් සියයට 50කටත් වඩා ණය බරින් සිටින බව පෙන්වා දෙන ලදි. තව ද රජයේ සහ සමුපකාර ණය දීම්වලින් ඔවුන්ගේ ණය අවශ්‍යතාවන්ගෙන් ඉතා කුඩා කොටසක් පමණක් පිරිමැසුන නිසා ඔවුන්ට වෙනත් මාර්ගවලින් ගිනි පොලියට ණය ගැනීමට සිදු විය. 1959 දී මේ තත්ත්වය හොඳ අතට හැරුණ බවට සාක්ෂි නැත. යෝජිත සමුපකාර සංවර්ධන බැංකුව තවමත් ක්‍රියාත්මක වී නැත.

## (ඇ) රජයේ මුදල් පරිහරණය

### 1958—59 මුදල් වර්ෂය

පසුගිය මුදල් වර්ෂවල අනුරූප තොරතුරු ඇතුලත්ව, 38 පිටේ 11—11 වැනි සටහනේ 1958/59 මුදල් වර්ෂය පිළිබඳව සංක්ෂෙපයෙන් දක්වා ඇති තොරතුරුවලින් පහළ දක්වෙන ප්‍රධාන ලක්ෂණයන් හෙළි වේ.

(අ) මුදල් වර්ෂය තුල රජයේ මුළු ආදයම රුපියල් කෝටි 133.04 ක් විය. මෙය 1957/58 වර්ෂයේ දී රුපියල් කෝටි 128.00ක් ද 1956–57 දී රුපියල් කෝටි 126.05 ක් ද විය.

(ආ) අයවැය ලේඛණයෙන් සම්මත වූ මුළු වියදම (නිදන් අරමුදල් දයක දීමනා හැර) රුපියල් කෝටි 173.8 ක් විය. මෙය 1957/58 දී රුපියල් කෝටි 156.57 ක් සහ 1956–57 දී රුපියල් කෝටි 132.36 ක් විය.

(ඇ) අත්තිකාරම් ගිණුම රුපියල් කෝටි .58 ක ශුද්ධ ගෙවීමක් විය. 1957/58 දී රුපියල් කෝටි 6.37 ක ශුද්ධ ලැබීමක් ද, 1956/57 දී රුපියල් කෝටි 13.33 ක ශුද්ධ ගෙවීමක්ද විය.

(ඈ) මුදල් වර්ෂයේ රජයේ අයවැය ගනුදෙනුවලින් කෝටි 41.34 ක ශුද්ධ හිඟයක් විය. 1957/58 දී මේ හිඟය රුපියල් කෝටි 22.23 ක් ද 1956/57 දී රුපියල් කෝටි 19.64 ක්ද විය.

(ඉ) 1958/59 අයවැය හිඟය පියවන ලද්දේ රජයේ මුදල් ශෙෂයන් රුපියල් කෝටි 6.17 කින් අඩු කිරීමෙන් සහ රුපියල් කෝටි 35.18 ක ශුද්ධ ණය ගැනීමකිනි.

1958/59 දී ශුද්ධ අයවැය හිඟය වූ රුපියල් කෝටි 41.34 වාර්තා වී ඇති ඉහළම ගණන වෙයි. එහෙත් මේ හිඟය වර්ෂය මුල දී ඇස්තමේන්තු කළ රුපියල් කෝටි 49.6 ට රුපියල් කෝටි 8.26 කින් අඩු විය. ඇස්තමේන්තුව හා නියම හිඟය අතර මේ වෙනසට ප්‍රධාන හේතුව වූයේ, රජයේ ප්‍රාග් ධන වියදමෙන් වැඩි කොටසක් වන ණය අරමුදල්වලට අයවෙන වියදම් රුපියල් කෝටි 17.2 කින් අඩුවීමය. කෙසේ වුව ද, වැඩිවශයෙන් ජංගම වියදම් වන ආදයමට අයවෙන වියදම, රුපියල් කෝටි 8.52ක් විය. 1958/59 මුල් අයවැය ඇස්ත මේන්තු හා සැසඳු විට, රජයේ ප්‍රාග් ධන සම්පාදනයේ අඩුවීමක්ද, පාරිභෝජන වියදමෙහි වැඩිවීමක් ද, ඇති වූ බව පෙනේ. නමුත් රජයේ නියම ආදයම, මුල් ඇස්තමේන්තුවලට අනුකූල විය.

### ආදයම

1958–59 මුළු ආදයම 1957/58 ට වඩා රුපියල් කෝටි 5 කින් වැඩි විය. ආදයම ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ ආයාත බදු වැඩිවීමය. 1957–58 දී රුපියල් කෝටි 29.2 ක් වූ ආයාත බදු 1958/59 දී රුපියල් කෝටි 36.7 ක් විය. ආයාත බදු මේ අන්දමින් වැඩිවීමට හේතු වූයේ ආයාත පරිමාව විශාල ලෙස වැඩිවීම හා 1958/59 අයවැය වාර්තාවෙන් බදු වැඩිවීමත් ය.

නිර්යාත බදු ආදයම (තේ බද්ද ඇතුළුව) පසු ගිය මුදල් වර්ෂයේ ආදයමට වඩා රුපියල්40 ලක්ෂයකින් වැඩි විය. වැඩි වූ ප්‍රධාන ශිර්ෂයන් වූයේ තේ (රුපියල් දශ ලක්ෂ 7) සහ පොල් නිෂ්පාදිත (රුපියල් දශ ලක්ෂ7) යන්ය. කුඩා තේ වතු හිමියන් ගේ සහනදයක ක්‍රමය යටතේ බද්දෙන් ආපසු ගෙවන ලද කොටස පසු ගිය අවුරුද්දට වඩා රුපියල් 26 ලක්ෂයකින් අඩු විය. (මෙය 1957/58 දී රුපියල් කෝටි 2.5 ක් වූ අතර 1958/59 රුපියල් කෝටි 2.24 ක් විය.) මේ නිසා තේ නිර්යාතයෙන් ලැබූ ශුද්ධ ආදයම රුපියල් කෝටි .96 ක් විය. රබර් නිර්යාතයෙන් ලැබුණ ආදයම රුපියල් කෝටි 1.1 කින් අඩු විය.

තේ සහ රබර්වලින් රජයට ලැබුණ ආදයමෙහි වෙනස්වීම බදු ප්‍රමාණයේ වෙනස්වීම නිසා ඇති වූ අතර, පොල්නිෂ්පාදිතයන්ගෙන් ලැබුණු ආදයම දියුණු වූයේ එහි නිර්යාත පරිමාව වැඩිවූ නිසාය. 1958 ජුලි මාසයේ රාත්තලකට ශත 28 සිට ශත 20 දක්වා අඩු කළ රබර් නිර්යාත බද්ද, 1959 සැප්තැම්බර් මාසයේ දී නැවත ශත 28 ක් කරනතුරු, එසේම පැවතිණ. 1959 මාර්තු මාස යේ දී තේ නිර්යාත බද්ද රාත්තලකට ශත 5 කින් ශත 65 ට වැඩි කරන ලදී.

| | 1951—52 | 1952—53 | 1953—54 | 1954—55 | 1955—56 | 1956—57 | 1957—58 | 1958–59 (ආ) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. ශුද්ධ අය වැය අතිරික්තයේ හෝ හිඟය (—) | — 257·1 | — 231.9 | 33·7 | 127·6 | — 1·2 | — 196·4 | — 222·3 | — 413·4 |
| (අ) ආදායම ... ... ... ... ... ... ... ... | 954·0 | 952·5 | 1,026·2 | 1,158·6 | 1,257·2 | 1,260·5 | 1,280·0 | 1,330·4 |
| (ආ) වියදම, එනම් ණයගැනීම් හෝ ණය දීම් ගනුදෙනුවල ශුද්ධ ලැබීම් හෝ ලැබීම් අත්හැර සම්පූර්ණ ගෙවීම්) .. .. | —1,211·1 | —1,184·4 | — 992·5 | —1,031·0 | —1,258·4 | —1,456·9 | —1,502·3 | —1,743·8 |
| ආදායමට අයවෙන වියදම (1) ඇතුළු (නිදන් අරමුදල් දායකදීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් හැර) (2) ආ (1) 'බලන්න)* (ආහාර ආධාර) | —1,004·6 (247·2) | — 893·5 (127·0) | — 772·0 (12·0) | —864·9(අ) (36·0)(අ) | —1,014·4 (79·5) | —1,105·2 (105·5) | —1,280.1 (112·0) | —1,432·2 (146·7) |
| (2) ණය හා ණය අරමුදල් වියදම (ණය කාර්යයන් සඳහා අත්තිකාරම් | — 203·0 | — 220·6 | — 162·3 | — 215·5 | — 211·0 | — 213·3 | — 282·6 | — 303·4 |
| (3) ජාතික සංවර්ධන සංචිතයට අයවන වියදම .. .. | — 7·7 | — 6·4 | — 3·2 | — 2·1 | — 4·0 | — 5·1 | — 3·0 | — 2·4 |
| (4) ගබඩා තොග හා උපකරණ ගිණුමට අත්තිකාරම් .. | — 16·8 | — 2·4 | 4·6 | 9·9 | 1·2 | — 14.5 | ... | 10·5 |
| (5) අනිකුත් අත්තිකාරම් | 19·0 | — 52·8 | — 61·1 | 34·0(අ) | — 30·3 | — 115·8 | 54·5 | — 17·1 |
| (6) විවිධ | 2·0 | — 8·7 | 1·5 | 7·6 | 0·1 | — 3·0 | 8·9 | 0·8 |
| **හිඟය පියවීම** | | | | | | | | |
| 2. රජයේ ණය ගැනීම් හා ණයදීම් ගනුදෙනුවලින් උද්ගත වන ශුද්ධ ලැබීම් හා ගෙවීම් (—) .. .. .. .. .. | 184·1 | 216·5 | — 35·3 | — 39·0 | 12·2 | 175·4 | 174·7 | 351·8 |
| (අ) පාලන ණයගැනීම් හා ණයගෙවීම් (විවිධ කටයුතු සඳහා ගත් ණය ඇතුළු) (1) තැන්පතු (නඩුකියන්නන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන් යනාදීන්ගෙන් හා වියදම් නොකොට ඉතිරිව ඇති විදේශාධාර) | — 34·2 | 11·9 | — 4·6 | 29·1 | — 36·5 | — 9·4 | 72·5 | 27·6 |
| (2) විවිධ අරමුදල් (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, රජයේ සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල ආදිය | — 16·2 | 21·4 | — 2·1 | 34·5 | — 10·8 | 9·0 | 73·9 | 27·3 |
| (3) විවිධ ණය (කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනයට ප්‍රාදේශීය ණය හා සංවර්ධන අරමුදල, පලාත්පාලන මණ්ඩල | — 0·6 | — 0·2 | 0·3 | — 0·9 | — 4·8 | — 2·3 | 20·1 | 4·2 |
| ආදියට) | 18·6 | — 9·3 | — 2·8 | — 4·5 | — 20·9 | — 16·1 | — 21·5 | — 3·9 |
| (ආ) දේශීය වෙළඳ ණය ගැනුම් හා ගත් ණය ආපසු ගෙවීම් | — 218·3 | 204·6 | — 94·0 | — 80·2 | 43·5 | 166·2 | 78·5 | 288·7 |
| (1) රුපියල් ණයකර .. .. .. | 102·4 | 80·0 | 70·0 | 75·0 | 74·5 | 94.9 | 45·0 | 95·0 |
| —නිදන් අරමුදල් දායක දීමනා හා ආදායමෙන් ගෙවන අවක්‍ර රාජ්‍ය ණය බේරීම් | **18·4** | **23·1** | **22·6** | **44·5** | **39·0** | **31·1** | **26·5** | **32·2** |
| (2) භාණ්ඩාගාර බිල්පත් .. .. .. .. | 84·0 | 56·9 | 47·4 | 30·5 | 35·5 | 63·8 | 18·5 | 62·8 |
| (3) මහ බැංකු අත්තිකාරම් | 62·3 | 90·6 | — 78·1 | — 44·9 | 8·0 | — 3·0 | 74·6 | 179·0 |
| (4) බදු සංචිත සහතික | 72·0 | — 1·5 | — 4·7 | — 65·8 | — | 96·3 | — 13·8 | 41·1 |
| (5) අනිකුත්† | — | — | — | — | — | 9·1 | — 0·8 | 5·8 |
| | — | 58·6 | — 51·6 | — | — | — | — | — |
| (ඇ) විදේශීය ණය ගැනීම් | — | — | 63·3 | 12·1 | 5·2 | 18·6 | 23·7 | 35·5 |
| 3. මුදල් ශේෂයන්ගේ වෙනස්වීම් (පහසුවෙන් මුදල්කළ හැකි වත්කම් ඇතුළුව) | — 73·0 | — 15·4 | — 1·6 | 88·6 | 11·0 | — 21·0 | — 47·5 | — 61·7 |

*ගතවූ වර්ෂවලදී වැයවූ ණය කාර්යයන් සඳහා අත්තිකාරම් ගිණුම්හි පාඩු, 'ආදායමට අයවෙන වියදම' සහ 'ණය අරමුදලට අයවෙන වියදම' යන ගිණුම්වලට මාරු කිරීමෙන් උද්ගතවන පොත් ගැලපිලි (හර සහ බැර) අත්හැර ඇත. එබැවින් ලංකාණ්ඩුවේ ගිණුම්වල සංඛ්‍යාවන් හා මෙහි සංඛ්‍යාවන් නොසැසඳේ.

†අර්ධරාජ්‍ය නියෝජ්‍යත්වයන්ගෙන් ගත් ණය (අ) 1954–55 හේ ආහාර ආධාර සඳහා වූ රුපියල්කෝටි 3.6 ක මුදලක් අත්තිකාරම් ගිණුමේ සිට ආදායමට අයවන වියදමට මාරු කරන ලදි. මේ පොත් ගැලපිල්ල 1958–59 සංඛ්‍යාවන්ගෙන් ඉවත්කර තිබුන ද (සංලක්ෂය බලන්න) 1954–55 සංඛ්‍යාවන් එය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කර ඇත. (ආ) තාවකාලිකයි.

1957/1958 — 1958/1959 කාලය අතර පහළ වැටුණ එකම ප්‍රධාන ආදයම් ශීර්ෂය වූයේ ආදයම් බද්දය (මුදල් බද්ද ආදිය ඇතු එව). 1957/58 රුපියල් කෝටි 28.96 ක් වූ මෙය, 1958/59 දී තියුණු අන්දමින් රුපියල් කෝටි 22.95 ට පහළ වැටිණ. ආදයම් බදු තක්සේරු කරනුයේ අවුරුද්දක පමාව ඇතිව, සමාගම්වල ඊට වැඩි කාලයක් පමාවක් ඇතිව, හෙයින්, ආදයම් බද්ද පහළ වැටීමට ප්‍රධාන හේතුව වශයෙන් සැලකිය හැක්කේ, 1955 - 1957 වර්ෂයන් අතර වූ නිර්යාත ආදයම පහත වැටීමය.

අනික් ආදයම් ශීර්ෂ අතර, දුම්රිය දෙපාර්තමේන්තුවෙන් සහ සුරාබදු හා ලුණුවලින් ලැබුණු ආදයම රුපියල් 90 ලක්ෂයකින් සහ කෝටි 1.5 කින් පිළිවෙලින් සැළකිය යුතු ලෙස වැඩි වී ඇත.

ඉහත සඳහන් කළ 1959 මාර්තු මාසයේ වූ තේ නිර්යාත බද්දෙහි වෙනස්වීම හැර තේ නිර්යාත බදු ක්‍රමය 1959 ජුනි මාසයේ දී සංශොධනය කරන ලදී. මෙතෙක් පැවති නිශ්චිත නිර්යාත බද්ද වෙනුවට වටිනාකම අනුව බද්දක් ද පනවන ලදී. අලුත් බදු ක්‍රමයෙන් තේ රාත්තලකට ශත 35 ක නිශ්චිත තීරු බද්දක් සහ කොළඹ තේ වෙන්දේසියේ පැනවෙන වටිනාකම අනුව බද්දක් ද ඇතුළත් විය. වටිනාකම් අනුව බද්ද, තේ රාත්තලක මිල 1.85 ට වැඩි වූයේ නම්, ඒ වැඩි මිලෙන් සියයට 50 ක් වෙයි. රාත්තලකට අය විය හැකි වටිනා කම අනුව වූ වැඩිම බද්ද ශත 70 ක් වෙයි. මේ අනුව රාත්තල රුපියල් 3.25 ට වැඩි වූයේ නම් වටිනාකම අනුව වූ බද්ද ඉන් පසු ව වූ මිල වැඩි වීම් සඳහා අය නොකරයි.

## සටහන (11—12)

### රජයේ වියදම්

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | ජංගම වියදම් | ප්‍රාග් ධන වියදම (1) (2) | | |
|---|---|---|---|---|
| | | මූර්ත වත්කම අත්කර ගැනීම ගොඩනැගීම සහ පවත්වා ගෙන යාම. | රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට දුන් ණය | මුළු |
| 1956/57 ... ... ... ... ... | 976·7 | 364·7 | 31·2 | 395·9 |
| 1957/58 ... ... ... ... ... | 1118·2 | 42?·3 | 76·3 | 498·6 |
| 1958/59 ... ... ... ... ... | | | | |
| මුල් ඇස්තමේන්තු ... ... ... | 1212·4 | 639·9 | 12·9 | 652·8 |
| මූර්ත (තාවකාලික) ... ... ... | 1266·2 | 461·5 | 39·8 | 501·3 |
| 1959/60 | | | | |
| මුල් ඇස්තමේන්තු ... ... | 1271·0 | 546·3 | — | 546·3 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(1) ප්‍රාග් ධන වියදම ලෙස සැළකෙන්නේ අවුරුද්දකට වඩා දිගු කාලයකට ප්‍රයෝජනය රඳා පවතින වත්කම් ගොඩනැංවීම,අත්කර ගැනීම හා පවත්වා ගෙන යාම සඳහා වියදම් සහ මූල්‍ය වත්ක ම් අත්කර ගැනීමේ වියදම්. (ප්‍රධාන වශයෙන් ලංගමයට හා වරාය සංයුක්ත මණ්ඩලයට ප්‍රාග් ධන කාර්යයන් සඳහා කෘ. සහ කා. ණය ආයතනය යනාදියට දෙන ලද ණය). සංවර්ධනයට ගැනෙන ශීර්ෂ ඇතුලත් වීමත්, සංවර්ධනය යටතේ ගැනෙන සමහර ශීර්ෂඇතුලත් නොවීමත්, නිසා ප්‍රාග් ධන වියදම් මේ අර්ථ නිරූපනය අනුව සංවර්ධනය. වියදම් හා සමාන නොවේ.

(2) අයවැය ලේඛනයට බාහිර ප්‍රාග් ධන වියදම් ද ඇතුලත් වේ.

### ජංගම වියදම

ඉහළ සඳහන් ප්‍රකාර, 1957–58 හා සැසඳු විට 1958/59 දී අයවැය හිඟය වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ ජංගම වියදමෙහි විශාල වැඩිවීමය. 1956/57 සිට 1959–60 දක්වා වූ ජංගම සහ ප්‍රාග් ධන වියදම්හි සංඛ්‍යා තොරතුරු ඉහත සටහනේ දක්වා ඇත. එය වඩා සවිස්තරව කාර්යානුකූලව වර්ග කර දක්වා ඇත්තේ 2 වන පරිශිෂ්ඨයෙහි 20 වන සටහනෙහි ය. 1958/59 පිළිබඳව, මෙසේ වර්ග කිරීමට හැකිවන සේ නියම වියදම් තොරතුරු සවිස්තරව නොමැති හෙයින් මෙහි සඳහන් වී ඇත්තේ මුල් ඇස්තමේන්තුවල සංඛ්‍යාවන්ය.

එසේ වුවද දැනට ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව 1958/59 ජංගම වියදම් වැඩි වී ඇත්තේ සමාජ සේවා වියදම්–අධ්‍යාපන (රුපියල් කෝටි 3.4) සෞඛ්‍යය (රුපියල් කෝටි 2.06) සහ සංක්‍රාම ගෙවුම්– (ආහාර ආධාර මුදල් රුපියල් කෝටි 3.50) විශ්‍රාම වැටුප් (රුපියල් කෝටි 1.2) රාජ්‍ය ණය පොලී (රුපියල් කෝටි0.6) සම්බන්ධයෙනි.

අධ්‍යාපනය සහ සෞඛ්‍ය පිළිබඳව වැඩිවීම සඳහා අය වැය ලේඛණයේ මුල් ඇස්තමේන්තු වල ද ඉඩ සලසා තිබුණි. නමුත් නියම වියදම මුල් ඇස්තමේන්තු වල ඉක්මවා ගියේ ය.

වැඩියෙන් ම ඉහළ ගිය වැය ශීර්ෂය වූයේ ආහාර ආධාර මුදලය. 1957/58 දී වූ රුපියල් කෝටි 11.2 ක් වූ මෙය 1958/59 දී රුපියල් කෝටි 14.67 ක් විය. ආහාර ආධාර මුදල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 480 රාජ්‍ය නීති ගිවිසුම යටතේ එක්සත් ජනපදයෙන් ලබාගත් සහල් හා පිටි සඳහා ගෙවූ අධික මිල හා සහතික කළ මිල ක්‍රමයට මෙ රට වී වැඩියෙන් මිලයට ගැනීමත් ය.

480 වැනි රාජ්‍යනීති ගිවිසුම යටතේ අමෙරිකන් එක්සත් ජනපදයෙන් ගෙන් වන සහල් මැට්රික් ටොන් එකක නැව් මිල රුපියල් 800 ක් වූ අතර, බුරුමයෙන් ගිවිසුම් යටතේ ගෙන් වූ ටොන් එකක ගොඩ බෑ මිල රු. 530 ක් විය. 1957/58 දී රුපියල් 463 (ආහාර දෙපාර්තමේන්තුව අනුව) ක් වූ රක්ෂණය හා නැව් කුලී සහිත සීනි මිල 1958/59 දී රුපියල් 384 ට අඩු විය. මේ අවුරුද්ද තුල (ආහාර දෙපාර්තමේන්තුව අනුව) සියලුම පිටි ටොන් එකක රක්ෂණය හා නැව් කුලී සහිත මිල රුපියල් 340 සිට රුපියල් 406 දක්වා වැඩි විය. 480 රාජ්‍ය නීති ගිවිසුම යටතේ එක්සත් ජනපදයෙන් ලබාගත් සහල් සහ පිටිවලට ගෙවිය යුත්තේ රුපියල් මුදලින් මිස විදේශීය මුදලින් නොවන බව සැලකිය යුතු ය. තව ද මේ රුපියල් ගෙවීමෙන් කොටසක් පරිත්‍යාග සහ දීර්ඝ කාලීන ණය මුදල් වශයෙන් ලංකා රජයට ආපසු දෙනු ලැබේ.

සහතික කළ මිල ක්‍රමය යටතේ රජය විසින් 1957–58 දී මිළට ගන්නා ලද වී, සහල් ප්‍රමාණය අනුව ටොන් 1,99,000 ක් වූ අතර 1958/59 දී මෙය ටොන් 2,91,000ක් විය.

**ප්‍රාග් ධන වියදම.*** මූර්ත ප්‍රාග් ධන වියදම් එම වර්ෂයේ මූලික අයවැය ඇස්තමේන්තු හා සසඳන විට 1958/59 දී සැළකිය යුතු අඩුවක් පෙන්වන අතර, 1957/58 දී නියම වියදමට වඩා මදකින් වැඩි වී ඇත. 1957/58 රුපියල් කෝටි 42.23 ක් වූ මූර්ත වත්කම් අත් කර ගැනීම, ගොඩනැගීම සහ පවත්වා ගෙන යෑම සඳහා රජයෙන් කළ අවක්‍ර වියදම් 1958/59 දී රුපියල් කෝටි 46.15 ක් දක්වා වැඩි වී ඇත. එහෙත් මේ කාලය තුළ දී ලංකා ගමනා ගමන මණ්ඩලය, සංයුක්ත මණ්ඩලය ආදී රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට රජයෙන් දුන් ණය 1957/58 දී රුපියල් කෝටි 7.63 සිට 1958/59 දී රුපියල් කෝටි 3.98 දක්වා අඩු වී ඇත.

1958/59 මූර්ත වත්කම් වියදම් පිළිබඳ ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව සවිස්තර කාර්‍යයානුකූලව වර්ග කිරීමක් කළ නොහැකි වුවද, 1958/59 දී වියදම් වැඩි වී ඇත්තේ කෘෂි කර්ම සංවර්ධනය සහ අධ්‍යාපනය පිළිබඳව බව හෙළි වේ.

**හිඟය පියවීම.** 1958/59 ශුද්ධ අයවැය හිඟය පියවූ ආකාරය, පසු ගිය අවුරුද්දේ සංසන්දනාත්මක තොරතුරුද ඇතුලත් ව ප්‍රධාන අංගවලට අනුව පහත සටහනේ දක්වා ඇත.

* සටහන II—12ට ඇති (1) අධොලිපිය බලන්න.

### සටහන 11—13

### හිඟය පියවීම

රුපියල් දශ ලක්ෂ

| | 1957/58 | | 1958/59(1) | |
|---|---|---|---|---|
| 1. පරිපාලන ණය ගැනීම් ... ... ... | 72·5 | | 27·6 | |
| 2. විදේශීය ණය ගැනීම් ... ... ... | 23·7 | | 35·5 | |
| 3. වෙළඳ ණය ගැනීම්–බැංකු නොවන මාර්ගයන්ගෙන් | 18·1 | | 109·4 | |
| 4. වෙළඳ ණය ගැනීම්—බැංකුවලින් ... | 60·3 | 107·8 | 179·3 | 241·0 |
| 5. රජයේ මුදල් අඩුවීම ... ... ... | 47·5 | | 61·7 | |
| 6. ශුද්ධ අයවැය හිඟය ... ... ... | — 222·3 | | —413·4 | |

(1) තාවකාලිකවෙයි. සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1958 ජුලි මාසයේ අය වැය කථාවෙන් මුදල් ඇමතිවරයා ප්‍රකාශ කළ පරිදි, 1958–59 මූලික අයවැය සැලැස්ම වූයේ වෙළඳ ණය ගැනීම් රුපියල් කෝටි 16 කට සීමා කිරීම හා ඇස්තමේන්තු වූ ඉතිරි හිඟය විදේශීය ආධාර වලින් පිය වීමය. 1958/59 දී ලබා ගැනීමට බලාපොරොත්තු වූ ණය ගැනීම් හා පරිත්‍යාග ඇතුළුවූ මුළු විදේශීය ආධාර ප්‍රමාණය රුපියල් 30 කෝටියකි. නමුත් නියම විදේශීය ආධාර* ලැබී ඇත්තේ රුපියල් කෝටි 5.38 ක් පමණෙකි. මෙයින් රුපියල් කෝටි 3.55 ක් ණය ගැනීම්වූ අතර රුපියල් කෝටි 1.83 ක් පිටි වලින් ලැබුණු පරිත්‍යාග විය. විදේශ පරිත්‍යාග අයවැය ලේඛනයට බාහිර යෝ ජනා ක්‍රම හා සම්බන්ධව ඇති හෙයින් අය වැය හිඟයන් පියවීමට ලබාගත හැකි වූයේ මෙයින් වියදම් නොවූ ශේෂයන් පමණෙකි. 1958/59 දී මෙසේ ලැබුණ මුදල රුපියල් කෝටි 1.09 ක් විය. මෙය ඉහළ සටහනේ පරි පාලන ණය යටතේ දක්වා ඇති සංඛ්‍යාවනට ඇතුලත් ය.

විදේශීය ආධාර සම්බන්ධයෙන් වූ බලාපොරොත්තු කඩවීම නිසා සැළකිය යුතු ණයක් දේශීය වෙළඳ පොලෙන්, විශෙෂයෙන් බැංකුවලින්, ගැනීමට සිදු විය. දේශීය වෙළඳ පොලෙන් ලබාගත් මුළු ණය ප්‍රමාණය 1957/58 දී රුපියල් කෝටි 7.84 ක් වූ අතර 1958/59 දී රුපියල් කෝටි 28.87 ක් විය. මේ රුපියල් කෝටි 28.87 න් රුපියල් කෝටි 17.74 ක් මහ බැංකුවෙන්ද, රුපියල් කෝටි 0.11 ක් වෙළඳ බැංකු වලින් ලබා ගන්නා ලදි.

1958/59 දී රජය බැංකු වලින් ලබාගත් මුළු ණය ප්‍රමාණය 1957/58 දී ලබාගත් ප්‍රමාණයට වඩා තුන් ගුණයකින් වැඩි විය.

රජයේ හිඟයෙහි උද්ධමන බලපෑම රජය බැංකුවලින් ලබාගත් ණය සහ රජයේ මුදල් ශෙෂය අඩුවීම යන දෙකෙහි එකතුවෙන් මැනෙන පරිදි 1958/59 දී රුපියල් කෝටි 24.10 ක් විය. මෙය 1957/58 දී රුපියල් කෝටි 10.78 ක් විය.

1958/59 දී වූ උද්ධමන බලපෑම 1957/58 වර්ෂයේ දී බලපෑම මෙන් දෙගුණයකුත් භාගයක් වුව ද, මේ කාලය තුල දී, බැංකු නොවන මාර්ගයන් ගෙන් රජය ලබාගත් ණය ගිය අවුරුද්දට වඩා හය ගුණයකින් වැඩිවීම විශේෂයෙන් සැළකිය යුතුය. මෙය 1957/58 දී රුපියල් කෝටි 1.81 ක් වූ අතර, 1958/59 දී කෝටි 10.94 දක්වා ඉහළ ගියේ ය. මෙයට ධාන ම හේතුව වූයේ ඉතිරි කිරීම් ආයතන, රක්ෂණ සමාගම්, අර්ථ සාධක සහ විශ්‍රාම අරමුදල් ආදී මාර්ගයන්ගෙන් රජයට ලැබුණු පෞද්ගලික ඉතිරි කිරීම් වැඩිවීමෙනි. මේ ආයතනයන්හි ඉතිරි කරන්නන් විසින් මිලයට ගත් රජයේ ණය පත් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළු) 1957/58 දී රුපියල් කෝටි 1.81 ක් වූ අතර 1958/59 දී රුපියල් කෝටි 7.69 ක් විය. අනිකුත් පෞද්ගලික ආයෝජනයන්, ප්‍රධාන වශයෙන් වෙළඳ සමාගම්, සතු වූ 1957/58 දී රජයේ ණය පත් ප්‍රමාණය රුපියල් කෝටි. 53 කින් අඩු වුවද, 1958/59 වර්ෂයේදී රුපියල් කෝටි 1.75 කින් වැඩි විය. බැංකු නො වන ආයෝජකයින් විසින් රජයේ ණය පත් මිලයට ගැනීම ඉහළ යෑමෙන්, රජයේ මුදල් ප්‍රතිපත්තිය නිසා ප්‍රසාරණය වූ පෞද්ගලික ආදයම් ද, 1956 සිට ඇති වූ නිර්යාත ආදයම් ප්‍රමාණය තරමක් දුරට ද, පිළිබිඹු වෙයි. අර්ථ–රාජ්‍ය නියෝජ්‍යත්වයන් වන උකස් බැංකුව හා ජාතික නිවාස අර මුදල වෙළඳ පොලින් ලබා ගත් ණය ප්‍රමාණය පහළ බැසීම රජයේ ණයපත් වැඩි වශයෙන් විකිණීමට මෙහිලා උපකාරී විය. මේ ආයතන දෙක 1957/58 දී ණය නිකුත් කිරීමෙන් රුපියල් කෝටි

* මෙහි සඳහන් වී ඇති විදේශීය ආධාර සම්බන්ධ සංඛ්‍යාවලට උපකරණ සහ සේවා වශයෙන් ලැබුන පරිත්‍යාග ඇතුලත් නොවේ. රාජ්‍ය නීති 480 යටතේ එක්සත් ජනපදයෙන් ලැබෙන සහල් සහ පිටිවලට ලංකා රුපියල් වලින් ගෙවිය යුතු හෙයින් විදේශාධාර ලෙස නොසැලකේ. විදේශාධාර ලෙස සැළකෙන්නේ එම රුපියල් ගෙවීම්වලින් පරිත්‍යාග හා ණය මුදල් ලෙස ආපසු දෙන ලද මුදල් පමණකි.

2.5 මුදලක් ලබාගත් අතර, 1958/59 දී ලබා ගත්තේ රුපියල් කෝටි 0.70 ක් පමණකි. 1957/58 දී ගත් රුපියල් කෝටි 2.5 න් රුපියල් කෝටි 2.16 ක් ම බැංකු නොවන ආයෝජකයන්ගෙන් ලබා ගත් අතර 1958/59 දී ලබාගත් මුළු මුදල වූ රුපියල් කෝටි 0.7 ලබා ගන්නා ලද්දේ මේ අංශයෙනි.

**රාජ්‍ය ණය;** දේශීය සහ විදේශීය රාජ්‍ය ණය පිළිබඳ විස්තර 2 වැනි පරිශිෂ්ටයේ 23 වැනි සටහනේ දක්වා ඇත. පසු ගිය මුදල් වර්ෂ සතර අවසානයේ වූ මුළු රාජ්‍ය ණය පිළිබඳ සංඛ්‍යා පහත සටහනින් දැක්වේ.

## සටහන II—14

## මුළු රාජ්‍ය ණය

රුපියල් දශ ලක්ෂ

| සැප්තැම්බර් අවසානය | දළ | (ශුද්ධ නිදන් අරමුදල් (හැර) |
|---|---|---|
| 1956 ... ... ... | 1161·3 | 942·7 |
| 1957 ... ... ... | 1363·9 | 1123·3 |
| 1958 ... ... ... | 1495·4 | 1212·1 |
| 1959 ... ... ... | 1837·0 | 1524·7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1958/59 දී සම්පූර්ණ දළ ණය සහ සම්පූර්ණ ශුද්ධ ණය රුපියල් කෝටි 34.16 කින් සහ රුපියල් කෝටි 31.26 කින් ඉහළ ගියේය. මෙය 1957/58 දී වැඩි වූයේ පිළිවෙලින් රුපියල් කෝටි 13.15 කින් සහ රුපියල් කෝටි 8.88 කිනි. 1958/59 දී රුපියල් කෝටි 34.16 වැඩි වූ දළ ණය ප්‍රමාණය ප්‍රධාන වශයෙන් සමන්විත වූයේ රුපියල් කෝටි 9.5 ක රජයේ ණය පත් වලින් ද රුපියල් කෝටි 18.0 ක නොගෙවූ භාණ්ඩාගාර බිල් පත් වලින් ද, රුපියල් කෝටි 4.11 ක මහ බැංකු අත්තිකාරම්වලින් ද, රුපියල් කෝටි 1.97 ක විදේශීය ණය ගැනීම් වලින් ය.

**රුපියල් ණය පත්;** 1958–59 වර්ෂයේ දී රුපියල් ණයපත් නිකුතු සයක් කරන ලදී. ඉන් දෙකක් 1958 සියයට $2\frac{1}{4}$ ණයකරය, අර්ධ වශයෙන් පරිවර්තනය සඳහා විය. පරිවර්තනය සඳහාවූ ණය කර දෙක, 1958 නොවැම්බර්–දෙසැම්බර්හි එක්විට ම නිකුත් කරන ලද 1963—1965 සියයට $2\frac{1}{2}$ සහ 1974/1978 සියයට $3\frac{1}{4}$— ණය කරයන්ය. මුළු මනින් ම අලුත් මුදල් සඳහා වූ අනිකුත් ණය කර සතරට 1959 ජනවාරි මාසයේ නිකුත් කළ 1975–79 සියයට $3\frac{1}{4}$ ණය කරය ද, 1959 අප්‍රේල් මාසයේ නිකුත් කළ (බී කාණ්ඩයේ) 1975–79 සියයට $3\frac{1}{4}$ ණයකරය ද, 1959 ජූලි මාසයේ නිකුත් කළ 1980/1984 සියයට $3\frac{1}{2}$ ණය කරය ද, 1959 සැප්තැම්බර් මාසයේදී නිකුත් කළ (බී කාණ්ඩයේ) 1980/84 සියයට $3\frac{1}{2}$ ණය කරය ද විය. රුපියල් කෝටි 12.05 ක් වූ නිකුතු සියල්ලට ම සම්පූර්ණයෙන් දයක වී ඇත. ණය කර සහභාගය බෙදී ගිය අන්දම පහත සටහනේ දක්වා ඇත.

## සටහන II—15

රුපියල් දශ ලක්ෂ

| දයක පංතිය | $2\frac{1}{2}$ % 1963/65 ණය | | $3\frac{1}{4}$ % 1974/78 ණය | | $3\frac{1}{4}$% 1975—79 ණය | $3\frac{1}{4}$% 1975—79 ණය | $3\frac{1}{2}$% 1980—84 ණ | $3\frac{1}{2}$% 1980—84 ණය | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පරිවර්තනය | මුදල් | පරිවර්තනය | මුදල් | | බී කාණ්. වර්ෂය | | බී කාණ්. වර්ගය | ප්‍රමාණය | සියයට |
| වෙළඳ බැංකු ... ... | 18·0 | — | 0·1 | — | — | — | 0·1 | — | 18·2 | 15·1 |
| ප්‍රාදේශීය සමුපකාර බැංකු ... | — | — | 0·2 | — | 0·7 | 0·4 | 0·4 | 0·4 | 2·1 | 1·8 |
| ඉතිරිකිරීමේ ආයතන ... ... | — | — | — | 0·7 | 9·7 | 2·8 | 9·1 | 8·0 | 30·3 | 25·7 |
| නිදන් අරමුදල් ... ... | — | — | — | — | 9·8 | 7·9 | 2·3 | 2·1 | 22·1 | 18·3 |
| දෙපාර්තමේන්තු සහ අනිකුත් රාජ්‍ය ණය ... ... | — | — | — | 1·1 | 1·1 | 0·2 | 0·1 | 2·2 | 4·7 | 3·9 |
| භාරකාර, අර්ථ සාධක සහ විශ්‍රාම අරමුදල් ... ... | 0·1 | — | ... | 2·7 | 3·4 | 6·3 | 10·0 | 5·7 | 28·2 | 23·4 |
| රක්ෂණ සමාගම් ... | — | 0·3 | 0·6 | 1·6 | 0·3 | 1·8 | 7·6 | 1·4 | 13·6 | 11·3 |
| අනිකුත් සමාගම් ... | — | ... | 0·1 | — | ... | 0·2 | 0·1 | — | 0·4 | 0·3 |
| පුද්ගලයින්, සමාජ සහ ආයතන ... ... | ... | — | — | ... | ... | 0·4 | 0·3 | 0·2 | 0·9 | 0·7 |
| | 18·1 | 0·3 | 1·0 | 6·1 | 25·0 | 20·0 | 30·0 | 20·0 | 120·5 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**භාණ්ඩාගාර බිල්පත්;** 1958/59 රාජ්‍ය ණය ඉහළ යාම වැඩි වශයෙන් ම සිදු වූයේ භාණ්ඩාගාර බිල් පත් සම්බන්ධයෙනි. 1958 සැප්තැම්බර් මස අවසානයේ දී රුපියල් කෝටි 14 ක් වූ මෙය 1959 සැප්තැම්බර් අවසානයේ දී රුපියල් කෝටි 32 ක් විය. ඉහළ ගිය භාණ්ඩාගාර බිල් පත් වැඩි වශයෙන් මිලට ගන්නා ලද්දේ මහ බැංකුව විසිනි.

1959 අප්‍රේල් 9 වැනි ද පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් භාණ්ඩාගාර බිල් පත් පිළිබඳ බලය ලත් සීමාව රුපියල් කෝටි 20 සිට රුපියල් කෝටි 35 දක්වා වැඩි කරන ලදී. මේ සීමාව 1959 ඔක්තෝබර් 29 වැනි ද නැවතත් රුපියල් කෝටි 45 දක්වා වැඩි කරන ලදී.

**විදේශීය ණය ගැනීම්;** විදේශ ශුද්ධ ණය රුපියල් කෝටි 1.97 කින් ඉහළ යාම වූයේ විදේශ ණය ගිවිසුම් යටතේ ලැබුණු රුපියල් කෝටි 3.55 ක ශුද්ධ ණය, රන්පවුම් ණයක් වූ රුපියල් කෝටි 1.35 ගෙවීමෙන් සමහන් වීමෙනි. විදේශ ණය ගිවිසුම් යටතේ ලැබුණු රුපියල් කෝටි 3.55 ක සම්පූර්ණ ශුද්ධ ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

## සටහන (11—16)

රුපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| ජාත්‍යන්තර සංවර්ධන සහප්‍රතිසංස්කරණ බැංකුව ... ... ... ... ... | 5·7 |
| අයි. සී. ඒ ... ... ... ... ... | 9·0 |
| එක්සත් ජනපදයේ සංවර්ධන ණය අරමුදල ... ... ... ... | 3·6 |
| එක්සත්, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව ... ... ... ... ... | 0·9 |
| කැනඩාව ... ... ... ... ... ... | 9·7 |
| චීන මහජන සමූහාණ්ඩුව ... ... ... ... ... ... | 6·6 |
| | 35·5 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

ජාත්‍යන්තර සමුපාකාර පාලන, (අයි සී ඒ) එක්සත් ජනපදයේ සංවර්ධන අරමුදල් සහ එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩු ණය, උපකරණ වශයෙන් ලැබුණු අතර, කැනේඩියානු සහ චීන ණය පිළිවෙලින් පිටි සහ සහල් වශයෙන් ලැබින.

**නිදන් අරමුදල්;** රාජ්‍ය ණය බේරීම සඳහා පිහිටුවා ඇති නිදන් අර මුදල්හි වටිනා කම, රුපියල් කෝටි 2.91 සිට 1958–59 වර්ෂය අවසාන වන විට රුපියල් කෝටි 31.24 ට නැංගේ ය. වර්ෂය තුල කල්පිරුණු රන්පවුම් ණයක් ගෙවීම සඳහා රුපියල් කෝටි 1.28 ක් නිදන් අරමුදලින් ඉවත් කර ගන්නා ලදී. එසේ වුවද, වර්ෂය තුල දී අර්ධ වාර්ෂික දයක දීමනා ලැබීමත්, නිදන් අරමුදල් ආයෝජනවලින් පොලී ලැබීමත් සහ වෙළඳ පොලේ ආයෝජනයන් ගේ වටිනාකම වැඩිවීමත් නිසා නිදන් අරමුදල්හි වැඩිවීමක් ඇති විය.

**රාජ්‍ය ණයපත් සම්බන්ධ වෙළඳ ගනුදෙනු;** පසු ගිය මුදල් වර්ෂ පහ ඇතුලත දී කළ රාජ්‍ය ණය පත් වෙළඳ ගනුදෙනු සම්බන්ධව තොර තුරු පහත සටහනේ දැක්වේ.

## සටහන 11—17

### රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ගනුදෙනු පරිමාව

| රජයේ මුදල් වර්ෂය | නිකුත් කරනු ලැබූ දේශීය ණය | බේරන ලද දේශීය ණය | නිකුත් කරන ලද පොලී බලපත්‍ර | | පිරිවැටුම | නිදන් අරමුදලින් කළ ආයෝජනය |
|---|---|---|---|---|---|---|
| | | | ගණන | වටිනාකම | | |
| | රුපියල් | රුපියල් | | රුපියල් | රුපියල් | |
| 1954—55 ... ... | 75,000,000 | 30,433,400 | 7,249 | 24,564,902 | 382,898,900 | 17,867,374 |
| 1955—56 ... ... | 100,000,000 | 47,363,400 | 6,902 | 26,408,664 | 179,397,000 | 21,330,022 |
| 1956—57 ... ... | 95,000,000 | 15,093,200 | 7,108 | 30,178,417 | 173,844,200 | 24,084,362 |
| 1957—58 ... ... | 79,474,400 | 56,143,700 | 6,639 | 29,585,738 | 260,069,800 | 26,977,182 |
| 1958—59 ... ... | 120,416,800 | 35,025,200 | 6,452 | 31,023,531 | 194,374,800 | 34,330,831 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**අර්ධ රාජ්‍ය ආයතනයන්ගේ ණය ගැනීම්;**

1959 දී රජයේ උකස් බැංකුව හෝ ජාතික නිවාස අරමුදල විසින් ණයකරයන් නිකුත් නො කරන ලදී. මුදල් වෙළඳ පොලේ පැවති හිඟයද, වියදම සඳහා රජයේ අධික ණය මුදල් ඉල් ලුම් ද නිසා ඉහත සඳහන් ආයතන දෙකෙහි මුදල් අවශ්‍යතාවන් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට පිළියෙල කරන ලදී.

**(1959/60 අය වැය ලේඛනය)**

1959 ජුලි මාසයේ දී මුදල් ඇමති වරයා විසින් යෝජනා කරන ලද පරිදි 1959/60 මුදල් වර්ෂය සඳහා වූ මුල් අය වැය සැලැස් ම පහත දැක්වේ.

සටහන II--18

මුල් අය වැය ඇස්තමේන්තු

රාපියල් දශ ලක්ෂ

| | |
|---|---|
| ජංගම වියදම් (නිදන් අරමුදල්වලට දයක දීමනා හැර) .. .. | 1,265.9 |
| ප්‍රාග් ධන වියදම් (අය වැය ලේඛනයට ඇතුලත්වා පමණක්) .. | 476.5 |
| මුළු සම්මත වියදම් .. | 1,7 4.4 |
| මුළු ආදායම් .. | --1,375.5 |
| ඇස්තමේන්තු කළ අයවැය හිඟය .. | 366.9 |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහා බැංකුවෙනි

වෙළඳ පොලෙන් රුපියල් කෝටි 15 ක ණයක් ද, රුපියල් කෝටි 12.5 ක විදේශීය ආධාර ද, පුරුදු මුදල් මාර්ගයන්ගෙන් රුපියල් කෝටි 5 ක් ද, ලබා ගැනීමෙන් හිඟය පියවීමට මුදල් ඇමති වරයා බලාපොරොත්තු විය.

**ආදයම්;** ඇස්තමේන්තු කළ ආදයම වූ රුපියල් කෝටි 137.55 ට අය වැය ලේඛනයේ යෝජිත අලුත් බදු වලින් ලබාගන්නට බලාපොරොත්තු වූ රුපියල් කෝටි 3.20 ක් ද ඇතුලත් ය. පිට රටින් ගෙන්වන මිල අධික මෝටර් කාර්, පැට්‍රල්, අත් ඔරලෝසු සහ මත් ද්‍රව්‍යයන් ගේ තීරු බදු වැඩි කිරීම ද, අරක්කු වල විකුණන මිල වැඩි කිරීම ද, පොල් නිෂ්පාදිතයන් ගේ නිර්යාත බදු වැඩිකිරීම ද අළුත් බදු යෝජනා වලට ඇතුළත් විය.

අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු රබර් නිර්යාත බද්ද දෙවරක් ම වැඩි කරන ලදී. 1959 සැප්තැම්බර් 9 වැනි ද රාත්තලකට ශත 20 සිට 28 දක්වා ද, 1959 නොවැම්බර් 11 වැනි ද රාත්තලකට තවත් ශත 10 ක් ද, වැඩි කරන ලදී. නොවැම්බර් 11 වැනිද බදු වැඩිකිරීම අනුමත කිරීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරියෙන් ඒ වෙනුවට සමාන නිර්යාත බලපත්‍ර ගාස්තුවක් අය කරන ලදී. මේ බදු අයකිරීම් දෙකෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1959/60 වර්ෂයේ දී රුපියල් කෝටි 3.6 කට ආසන්න වැඩිපුර ආදයමක් බලාපොරොත්තු විය හැකිය.

**ජංගම වියදම්**

1958/59 කෝටි 121.24 ක් වූ මූලික අය වැය ඇස්තමේන්තුව හා සැසඳු කල 1959/60ජංගම වියදම් ඇස්තමේන්තු ඉහළ ගොස් ඇත්තේ ප්‍රධාන වශයෙන්, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවා ඇතු ලත්, සමාජ සේවා සම්බන්ධයෙනි. පසුගිය මුදල් වර්ෂ වල මෙන් ම 1959/60 දී ද නියම ජංගම වියදම්, අතිරේක වැය ඇස්තමේන්තු නිසා, මූලික ඇස්තමේන්තු ඉක්ම යා හැක. 1959 දෙ සැම්බර් අවසාන වන විට රුපියල් කෝටි 7 ක අතිරේක ඇස්තමේන්තු සම්මත වී තිබිණ.

1959/60 ආහාර ආධාර සඳහා වෙන් කල මුදල රුපියල් කෝටි 10.81 වීම සැළකිය යුතු ය. මෙය 1958/59 මුල් ඇස්තමේන්තුව හා සමානය. 1958/59 දී මේ සඳහා වූ නියම වියදම් රුපියල් කෝටි 14.67 කි.

**ප්‍රාග් ධන වියදම්;** 1959/60 සඳහා ඇස්තමේන්තු වී ඇති සම්පූර්ණ ප්‍රාග් ධන වියදම (අය වැය ලේඛනයට බාහිර වියදම් ද ඇළුතුව) රුපියල් කෝටි 54.63 කි. මෙය 1958/59 යේ බලා පොරොත්තු ඇස්තමේන්තුව වූ රුපියල් කෝටි 63.99 ට අඩු වූව ද, (රාජ්‍ය නියෝජ්‍යත්වයන්ට දුන් ණය හැර) 1958-59 නියම ප්‍රාග් ධන වියදම් හා සසඳන විට රුපියල් කෝටි 8.5 ක වැඩිවීමක් පෙන්වයි.

**හිඟය පියවීමේ යෝජනා:**

දේශීය බැංකු නොවන දේශීය වෙළඳ ආයෝජනයන්ගෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වූ කෝටි 15 ක මුදල් 1958/59 දී මේ මාර්ගයෙන් ලැබුණු මුදලට වඩා රුපියල් කෝටි 4.0 කින් වැඩිය. මේ වැඩි ඇස්තමේන්තුව, රජයේ මුදල් ප්‍රතිපත්ති නිසා වී ඇති, ආදයම් ප්‍රසාරණය ද, නිර්යාත අය පිළිබඳ වූ දියුණු ව ද, සේවා අර්ථසාධක අරමුදලේ මුල්‍ය එකතුකිරීම් වැඩිවීම ද, සැලකිල්ලට භාජන කොට, කරන ලද්දකි. සේවක අර්ථසාධක අරමුදලේ පාලනය යටතට ගැණුන සේවාවන්ගේ ප්‍රමාණය 1959 දෙසැම්බර් මාසයේ දී වැදගත් ප්‍රමාණයකට පුලුල් කිරීම සැළකිය යුත්තකි.

විදේශ ආධාර පිළිබඳ ඇස්තමේන්තු 1958/59 මුල් ඇස්තමේන්තුවලට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු වුව ද, ඒ පිළිබඳ විස්තර ප්‍රකාශ වී නැත.

**රජයේ මුදල් ගනුදෙනු—1956 ඔක්තෝබර් සිට 1960 ජනවාරි දක්වා**

1959/60 මුල් මාස හතර තුල රජයේ මුදල් ගනුදෙනු පිළිබඳ ලැබී ඇති තොරතුරු, කාලය තුල දී වූ ශුද්ධ අය වැය හිඟය දැක්වීමට ප්‍රමාණවත් නොවුන ද, සැළකිය යුතු ණය ගැනීමක්-විශෙෂයෙන් භාණ්ඩාගාරික බිල්පත් මගින්, හෙළි කරයි. මේ කාලය තුල දී රුපියල් කෝටි 17.78 ක ශුද්ධ ණය ගැනීමක් ඇති විය. මෙයින් රුපියල් කෝටි 13.0 ක් ලබා ඇත්තේ භාණ්ඩ ගාර බිල්පත් නිකුත් කිරීමෙනි. නිකුතු ප්‍රධාන වශයෙන්, ගන්නා ලද්දේ බැංකු විසිනි. භාණ්ඩා ගාර බිල්පත් පිළිබඳ ව්‍යවස්ථා පිට සීමාව, 1959 ඔක්තෝබර් 29 වැනි ද පාර්ලිමේන්තුවේ යෝජනා සම්මුතියකින්, රුපියල් කෝටි 35 සිට රුපියල් කෝටි 45.0 හේ සීමාව දක්වා වැඩි කරන ලදී. 1960 ජනවාරි මැද හරියේ දී, භාණ්ඩාගාර බිල්පත් නිකුතුව මේ වැඩි කල සීමාව දක්වා පැමිණියේ ය. අනිකුත් ණය ගනුදෙනුවලට රුපියල් කෝටි 2.50 ක රුපියල් ණයකරයක නිකුතුවක්ද මහ බැංකු ණය රුපියල් කෝටි 1.04 කින් වැඩි වීමක් ද ප්‍රධාන වශයෙන් ඇතුලත් විය.

මේ කාලය තුල දී ලැබුණ මුළු විදේශීය ණය ප්‍රමාණය රුපියල් කෝටි 1 ක් විය. මේ කාලය තුල දී ලැබුණු විදේශීය ත්‍යාග දීමනා පිළිබඳ තොරතුරු තවම ලැබී නැත.

## (ඇ) ජාත්‍යන්තර ගනුදෙනු සහ විදේශීය වත්කම්

1959 ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ විස්තර 25(අ), (ආ) සහ (ඇ) යන සංඛ්‍යා සටහන්හි දක්වා ඇත. තාවකාලික ඇස්තමේන්තු අනුව 1959 ලංකාවේ ගනුදෙනුවලින් රුපියල් කෝටි 17.7ක හිඟයක් පෙන්වා ඇත. 1958 දී මේ හිඟය රුපියල් කෝටි 15.3 ක් විය. පියවීමට අවශ්‍ය වූ මුළු හිඟය ද 1958 දීට වඩා විශාල විය. 1958 දී රුපියල් කෝටි 19.3ක් වූ මෙය තාවකාලික ඇස්තමේන්තු අනුව 1959 දී රුපියල් කෝටි 22·5කට ආසන්න විය. (සටහන 11—19 (ආ) බලන්න.)

1959 යේ ජාත්‍යන්තර ගනුදෙනු තත්වය අවාසි වූයේ අවුරුද්ද තුල වූ ආයාතවියදමේ සැළකිය යුතු වැඩිවීම නිසා වෙළඳ භාණ්ඩ ශේෂයේ* පහළ වැටීමෙනි. ගිය අවුරුද්දේ රුපියල් කෝටි 0·8ක අතිරික්තයක් පෙන්වූ වෙළඳ භාණ්ඩ ගිණුම මේ අවුරුද්දේ කෝටි 9.52ක හිඟයක් පෙන්වූයේය. පෞද්ගලික මුදල් පිට රට යැවීම හා සංක්‍රමනිකයන්ගේ මුදල් ගෙන යාම සැළකිය යුතු ලෙස අඩු වීමත්, පරිත්‍යාග ලැබීම් ප්‍රමාණවත්ව වැඩිවීමත් නිසා ජංගම අද්‍යශ්‍ය ගිණුමෙහි දියුණුවකින්, මෙය, තරමක් දුරට සමහන් විය.

ජංගම අද්‍යශ්‍යයන්—අද්‍යශ්‍යයන්හි හිඟය 1959 තුල ලැබූ පරිත්‍යාග විශාල ලෙස වැඩිවීම නිසා සැළකිය යුතු ලෙස අඩු විය.**මේ අවුරුද්ද තුල පරිත්‍යාග වශයෙන් රුපියල් කෝටි10.12ක් ලැබිණ. 1959 යේ දී ජංගම අද්‍යශ්‍ය ගිණුමෙහි මුළු හිඟය පරිත්‍යාග දීමනා ද ඇතුළුව රුපියල් කෝටි 8.16ක් විය. (සටහන 11—18 බලන්න.)

* මේ වාර්තාවලින් වෙළඳ ශෙෂයන් ගුණනය කිරීම හා ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ සටහනේ වෙළඳ භාණ්ඩ ගිණුම් ගුණනය කිරීම් (ඉහත විදේශීය වෙළඳාම යන පරිච්ඡෙදයේ මෙන්) පිළිබඳ ක්‍රමයන්හි වෙනස මේ පරිච්ඡෙදය අවසානයේ විස්තර කෙරෙයි.

** මෙයට විදේශීය මුදලින් ගෙවීම අනවශ්‍යය. අමෙරිකන් කාර්මික ආධාර—එක්සත් ජනපදයේ 480 වන රාජ්‍ය නීතිය යටතේ දෙන ලද ආධාර ඇතුලත් වෙයි.

පිටරට ගමන් සඳහා වූ ශුද්ධ බැහැර ගෙවීම් ගිය අවුරුද්දේ මට්ටමට ආසන්නව පැවතිණ. පරිවහණය සහ රක්ෂණය සඳහා වූ ශුද්ධ හිඟය 1957 දී රුපියල් කෝටි 7.96යේ සිට 1958 දී රුපියල් කෝටි 2.13 දක්වා අඩු වුව ද, 1959 දී එය ඇස්තමේන්තු කළ ගණන වූ කෝටි 29.4ට නැංගේය. මේ ගිණුමෙහි බැහැර ගෙවීම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නැව් කුලී ඉහළ යාම සහ වෙළඳ පරිමාව වැඩිවීමය. වරායේ ආදයම ගිය අවුරුද්දේ මෙන් ඉහළ මට්ටමක පැවතෙමින් තිබිණ.

1959 යේ ආයෝජන ආදයම සඳහා වූ රුපියල් කෝටි 34.8ක ශුද්ධ බැහැර ගෙවුම් 1958 මට්ටමට වඩා මදක් අඩු විය. එක්සත් රාජධානියෙන් හමුද තොටු පලවල් පවරා ගැනීම හේතු කොට ගෙන 1958 දී ප්‍රථම වරට වාර්තා වූ රජයේ වියදම්වල ශුද්ධ හිඟය, එපරිදිම පැවැත්තේ ය. 1959 දී ඇති වූ ශුද්ධ හිඟය, තාවකාලික සංඛ්‍යා තොරතුරු අනුව රුපියල් 9 ලක්ෂයක් විය.

පෞද්ගලික මුදල් පිටරට යැවීම හා සංක්‍රමිකයන්ගේ මුදල් යැවීම් නිසාත් බැහැරගිය ශුඬ මුදල් ප්‍රමාණය 1958 දී ඉහළ නැගුන ද, 1959 දී පහළ බැස්සේ ය. මේ සඳහා යවන ලද රුපියල් කෝටි 5.58ක සම්පූර්ණ මුදල 1958 වේ සංඛ්‍යාවට වඩා රුපියල් කෝටි 2.2කින් පමණ අඩුය. මුදල් පිටරට යැවීම අඩු වූයේ විශේෂයෙන් ම ඉන්දියාවට නඩත්තුව සඳහා යවන ලද මුදල් ප්‍රමාණයෙහි හා සංක්‍රමිකයන්ගේ මුදල් යැවීම් ප්‍රමාණයෙහි පහත වැටීම නිසාය.

**සටහන 11—19 (ආ)**

**1958–1959 ජංගම අදාශායයන්.**

රුපියල් දශ ලක්ෂ

| | 1958 | | ශුඬ | 1959 | | |
|---|---|---|---|---|---|---|
| | හර | බැර | | හර | බැ | ශුඬ |
| මූල්‍ය නොවන රන් (ශුද්ධ) සංචලන ... | — | — | — | — | 1·9 | — 1·9 |
| විදේශීය සංචාර ... ... ... ... | 6·9 | 36·9 | — 30·0 | 7·0 | 38·9 | — 31·9 |
| පරිවහණය හා රක්ෂණය ... ... | 139·5 | 160·8 | — 21·3 | 140·3 | 169·7 | — 29·4 |
| ආයෝජන ආදයම ... ... ... ... | 36·6 | 77·2 | — 40·6 | 33·7 | 68·5 | — 34·8 |
| ආණ්ඩුවේ වියදම .. ... ... ... | 32·5 | 36·5 | — 4·0 | 36·8 | 37·7 | — 0·9 |
| විවිධ ... ... ... ... ... | 42·4 | 83·9 | — 41·5 | 53·1 | 81·2 | — 28·1 |
| පෞද්ගලික හා සංක්‍රමිකයන්ගේ මුදල් යැවීම් | 7·4 | 85·4 | — 78·0 | 7·6 | 63·4 | — 55·8 |
| පරිත්‍යාග ... ... ... ... ... | 54·9 | — | + 54·9 | 101·2 | — | +101·2 |
| එකතුව ... | 320·2 | 480·7 | —160·5 | 379·7 | 461·3 | — 81·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

පෞද්ගලික ප්‍රාග් ධන.—1958 දී සැළකිය යුතු අන්දමින් අඩු වූ පෞද්ගලික ප්‍රාග් ධන ගිණුමේ ශුද්ධ බැහැර යාම එම පහළ තත්ත්වයේ ම පැවතිණ. මෙය තාවකාලික ඇස්තමේන්තු අනුව රුපියල් දශ ලක්ෂයක් පමණ විය. මේ ගිණුමෙහි පිට රට මුදල් යැවීම් අඩු වූයේ ප්‍රධාන වශයෙන් විදේශීයයන් සතු වතු සහ මෙහි නේවාසික නොවන අයගේ රුපියල් වෙළඳ සමාගම් කොටස් විකුණා සිය රට යැවූ ප්‍රාග් ධන අඩුවීමෙනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1957 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මකව පැවතුන, සමහර වර්ගවල ප්‍රාග් ධන බැහැර කිරීම් සම්බන්ධව වූ සීමා කිරීමය.

අවක්‍ර ආයෝජනයන්හි ශුද්ධ බැහැරවීම, රුපියල් කෝටි 0.92ක් වූ අතර වෙනත් දීර්ඝ කාලීන ප්‍රාග් ධනයන්ගේ ශුද්ධ බැහැරවීම, රුපියල් කෝටි 0.14ක් විය. පසුගිය අවුරුද්ද හා සසඳන විට අවක්‍ර ආයෝජන සහ වෙනත් දීර්ඝ කාලීන ප්‍රාග් ධන සම්බන්ධයෙන් පිටට ඇදී ගිය මුදල පහළ බැස ඇතිවාක් මෙන් ම, ආයෝජනයන් පිණිස මෙරටට ගලා ආ පෞද්ගලික ප්‍රාග් ධන ප්‍රමාණය ද අතිශයින් ම අඩු විය. මෙය රුපියල් කෝටි 0.17ක් පමණ විය. කෙටි කාලීන ප්‍රාග් ධන සංචලනයන්හි, ප්‍රධාන වශයෙන් ''විශේෂ ගිණුම්''* යටතේ රුපියල් කෝටි 0.93ක් බැහැර ගිය බැව් සටහන් වී ඇත.

**පියවුම් ගිනුම.**—1956 දී ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු ශේෂය පහළ අතට හැරීමෙන් පසු වෙළඳ භාණ්ඩ ගිණුමෙහි අතිරික්තයන් මඳ වූ නිසා ගිය අවුරුදු කීපය තුළ දී ජංගම ගිණුමෙහි ප්‍රමාණවත් හිඟයක් ඇති විය. 1959 අදාශායයන්ගේ හිඟයෙහි මඳ දියුණුවකින් මෙය තරමක් දුරට සමහන් වුව ද, භාණ්ඩ ශේෂය වැඩි දුරටත් පහළ බැසීම නිසා ජංගම ගිණුමෙහි හිඟය වැඩි

* මේ වර්ෂය යටතේ දක්වෙනුයේ විනිමය පාලනයෙහි පරිපාලනය යටතේ රන්පවුම් වෙළඳ සමාගම් හා අනිකුත් විශාල වෙළඳ සමාගම් හා ඒවායේ ප්‍රධාන කාර්යාලයන් හා ප්‍රධානයන් අතර වූ ගනුදෙනුය. නොගෙවූ ශේෂයන් පමණක් බැංකු මගින් ත්‍රෛමාසිකව බේරුම් කෙරෙයි.

විය. මේ හේතුවෙන් විදේශීය වත්කම් මට්ටම ගිය අවුරුද්දට වඩා විශාල ප්‍රමාණයකින් අඩු විය. 1958 වූ සැළකිය යුතු අඩුවීමෙන් පසු පෞද්ගලික ප්‍රාග් ධන උදෙසා වූ ශුද්ධ බැහැර වීම් පහත් තත්ත්වයක පැවතිණ. පහළ වැටීම් අතට හැරී තිබුණ පෞද්ගලික ප්‍රාග් ධන ගලා ඒම ද පැවතුනේ අතිශයින් ම අඩුවය.

1959 දී ජංගම ගිණුමේ හිඟය රුපියල් කෝටි 17.68ක් වූ අතර පෞද්ගලික ප්‍රාග් ධනයෙහි අවක්‍ර ආයෝජන සහ අනිකුත් දීර්ඝ කාලීන ආයෝජන වූ බැහැරවීම් රුපියල් කෝටි 1.06ක් විය. පෞද්ගලික ප්‍රාග් ධන ගිණුමේ පිටට ඇදී ගිය මුළු ශුද්ධ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂයක් විය.

1959 යේ තවත් විශේෂ ගෙවුම් කීපයක් ද විය. ජාත්‍යන්තර අරමුදලට එහි වැඩි වූ සහභාග මුදලින් සියේට 25ක මුදල වූ රුපියල් කෝටි 3.57ක් ගෙවීම මේ විශේෂ ගෙවුම් අතර ප්‍රධාන තැනක් ගත්තේ ය. ජාත්‍යන්තර සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ බැංකුවෙන් ලබා ඇති ණය බේරීම සඳහා කොටස් වශයෙන් ගෙවන මුදල් රුපියල් කෝටි 0.24ක් විය. 1959 හිඟය පිය වීමට සම්බන්ධිත පියවුම් ශීර්ෂයන් පහත දැක්වෙන පිළිවෙළට පෙන්විය හැකිය.

(අ) පිටරට වත්කම් රුපියල් කෝටි 19.45ක් අඩු කිරීම
(ආ) ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ ශෙෂයන්හි බැර තත්ත්වයේ රුපියල් කෝටි 1.75ක අඩුවීම.
(ඇ) දීර්ඝ කාලීන වගකීම්හි රුපියල් කෝටි 3.67ක වැඩිවීම.
(ඈ) අනිකුත් කෙටි කාලීන ප්‍රාග් ධනයෙහි රුපියල් 24 ලක්ෂයක වැඩිවීම.

1958 දී හිඟය, ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම යටතේ ගෙවීම් කල් දැමීමෙන් බොහෝ සෙයින් පිරිමැසුන අතර, 1959 හිඟය පිරිමැසුනේ බොහෝ සෙයින් ම විදේශීය වත්කම් අඩු කිරීමෙනි. ජංගම ගිණුමේ හිඟය රුපියල් කෝටි 2.4කින් වැඩි වුව ද, විදේශීය වත්කම් ගිය අවුරුද්දට වඩා රුපියල් කෝටි 13කින් ම පහළ වැටිණ. මෙයට හේතු වූයේ ජංගම ගිණුමේ හිඟය 1959 දී අධික වීමත්, ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ වූ වගකීම්වල අඩුවීමත් නිසාය.

1958 හා සසඳන විට 1959 දී ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම යටතේ ඇති වූ ගනුදෙනුවල ශුද්ධ ඵලයෙහි සැළකිය යුතු වෙනසක් ඇති විය. 1959 දී ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ වූ ගනුදෙනුවලින් විය හැකි හිමිකම් රුපියල් කෝටි 1.19කින් පහළ බැස්සේය. 1958 දී ගෙවීම් කල් දැමීමෙන් ඇති කරගත් වගකීම් රුපියල් කෝටි 5.13කින් ඉහළ ගිය අතර, 1959 දී රුපියල් කෝටි 2.94කින් පහළ බැස්සේය.

### සටහන 11—19 (ආ)

### 1958 සහ 1959 ජාත්‍යන්තර ගනුදෙනුවල පියවුම් ස්වරූපය

| | 1958 | 1959 තාවකාලිකව |
|---|---|---|
| ජංගම ගිණුම—භාණ්ඩ, සේවා හා පරිත්‍යාග | —152·9 | —176·8 |
| පෞද්ගලික ප්‍රාග් ධන ගිණුම් | — 14·4 | — 10·3 |
| ණය ආපසු ගෙවීම්* | — | — 26·6 |
| ජාත්‍යන්තර මුදල් මණ්ඩලයට රන්වලින් කළ දායක දීමනා | — | — 35·7 |
| වැරදීම් සහ අත්හැරීම් (ශුද්ධ) | — 25·5 | + 24·0 |
| මුළු පියවුම් හිඟය | —192·8 | —225·4 |
| **මුළු පියවුම් හිඟය**** | | |
| (අ) පෞද්ගලික ප්‍රාග් ධන† | + 10·4 | + 9·3 |
| (ආ) රාජ්‍ය සහ බැංකු ප්‍රාග් ධන | +182·4 | +216·1 |
| 1. විදේශීය වත්කම්හිඅඩුවීම් (දළ) | + 59·8 | +194·5 |
| 2. ගෙවීම් ගිවිසුම් යටතේ හර ශෙෂයේ වෙනස්වීම් | + 45·2 | + 11·9 |
| 3. ගෙවීම් ගිවිසුම් යටතේ බැර ශෙෂයේ වෙනස්වීම් | + 51·3 | — 29·4 |
| 4. රාජ්‍ය වගකීම්වල අධිකවීම් (දීර්ඝ කාලීන) $ | + 22·4 | + 36·7 |
| 5. අනිකුත් කෙටි කාලීන ප්‍රාග් ධන‡ | + 3·7 | + 2·4 |
| ජාත්‍යන්තර තත්වයෙහි ශුද්ධ වෙනස්වීම් | +192·8 | +225·4 |

* රන් පවුම් 18,15,000ක ණය ගෙවීම් සහ ජාත්‍යන්තර සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ බැංකු ණය ගෙවීම් ද ඇතුලත් වෙයි.
† විශේෂ ගිණුම් ශෙෂයන්හි වෙනස්වීම්වලින් යුක්තයි.
$ ජාත්‍යන්තර සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ බැංකුව, කැනඩාව, එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව, අයි. සී. ඒ. ආයතනය, සංවර්ධන ණය අරමුදල සහ චීනයෙන් ගත් ණය මුදල්වලින් ද සමන්විතය.
‡ මහ බැංකුවේ හා වෙළඳ බැංකුවල මෙරට නේවාසික නොවන්නන්ගේ ගිණුම් ශෙෂයන්හි හා පිටරට තානාපති කාර්යාලවල ශෙෂයන්හි ද වෙනස්වීම් ඇතුලත් ය.
** ගිණුමේ ධන ලකුණ වත්කම්වල අඩුවීම හෝ වගකීම්වල අඩුවීම පෙන්වයි. රින ලකුණ වත්කම්වල වැඩිවීම හෝ වගකීම්වල අඩුවීම පෙන්වයි.

**ප්‍රාදේශීය ගනුදෙනු පිළිවෙළ**

1959 යේ දී ජාත්‍යන්තර ගනුදෙනු, ප්‍රදේශ අනුව 1958 ආකාරයම බොහෝ සෙයින් අනුගමනය කළේය. ඩොලර් කලාපය සමඟ හැර ලෝකයේ අනිකුත් මූල්‍ය කලාප සමඟ ගනුදෙනුවල දී, ලංකාවේ ජංගම ගිණුම්හි හිඟ ඇති විය. ඩොලර් කලාපය සමඟ අතිරික්තය ගිය අවුරුදු තුනට වඩා අඩු විය. එසේ වුව ද, 1958 අතිරික්තයට වඩා 1959 අතිරික්තය මදක් වැඩි විය. 1958 අතිරික්තයට වඩා 1959 අතිරික්තය රුපියල් කෝටි 17.04ක් වූ අතර 1959 දී අතිරික්තය රුපියල් කෝටි 2.2කින් වැඩි වී රුපියල් කෝටි 19.23ක් විය.

1957 දී වූ රුපියල් කෝටි 33.65ක රන් පවුම් කලාපය සමඟ වූ හිඟය 1958 දී රුපියල් කෝටි 14.73ට අඩු විය. යළිත් 1959 දී එය රුපියල් කෝටි 31.93 දක්වා ඉහළ නැංගේය. එක්සත් රාජධානිය සමඟ වූ හිඟය රුපියල් කෝටි 8.3කින් වැඩිවීමත්, ඉන්දියාව සහ පකිස්තානය සමඟ වූ හිඟය රුපියල් 60 ලක්ෂයකින් වැඩිවීමත් හා රන් පවුම් කලාපයේ වෙනත් තුබුණු අතිරික්තයන් රුපියල් කෝටි 8.3කින් අඩුවීමත් නිසා තත්වය නරක අතට හැරුණි. මේ අන්දමින් හිඟය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආයාත වැඩිවීමය.

ඩොලර් හෝ රන් පවුම් හෝ නො වන කලාප අතර වූ ගනුදෙනුවලින් පළමු වරට හිඟයක් සටහන් වූයේ 1957 දීය. 1958 දී මේ හිඟය තව දුරටත් වැඩි වී රුපියල් කෝටි 17.6ක් විය. එසේ වුව ද 1959 දී හිඟය රුපියල් කෝටි 4.93ක් විය. 1959 දී මේ දියුණුව ඇතිවීමට හේතු වූයේ මහාද්වීපික ඕ. ඊ. ඊ. සී. රටවල් සමඟ වූ හිඟය රුපියල් දෙකෝටියකින් අඩුවීම හා අනිකුත් ලෝකය සමග වූ ශුද්ධ හිඟ තත්වය රුපියල් කෝටි 10.7කින් අඩුවීමත්ය. ඕ. ඊ. ඊ. සී. රටවල් සමඟ හිඟයෙහි අඩුවීම, 1958 දීද දක්නට ලැබින.

**සටහන 11—20**

**මූල්‍ය කලාප අනුව ජංගම ගිණුම් අතිරික්තය (–) හෝ හිඟය (–)**

රුපියල් දශ ලක්ෂ

| | 1957 | 1958 | 1959 තාවකාලික |
|---|---|---|---|
| 1. ඩොලර් කලාපය ... ... ... ... ... ... | +184·8 | +170·4 | +192·3 |
| 2. රන්පවුම් කලාපය ... ... ... ... ... ... | —336·5 | —147·3 | —319·8 |
| මෙයින් එක්සත් රාජධානිය ... ... ... ... | —176·7 | — 82·4 | —165·3 |
| ඉන්දියාව හා පකිස්තානය ... ... ... | —244·4 | —233·2 | —239·7 |
| අනිකුත් ... ... ... ... ... | + 84·6 | +168·3 | + 85·2 |
| 3. ඩොලර් හෝ රන් පවුම් නොවන කලාප ... ... ... | — 43 6 | —176.0 | — 49.3 |
| මෙයින් මහාද්වීපික ඕ. ඊ. ඊ. සී. රටවල් ... ... ... | — 77.6 | —25.7 | — 6.0 |
| අනිකුත් ... ... ... ... ... | + 34·0 | —150·3 | — 43·3 |
| එකතුව ... ... | —195·3 | —152·9 | —176·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

අර්ධ වාර්ෂිකව සලකන විට 1958 මුල් භාගයේ දී රුපියල් කෝටි 16.38ක හිඟයක් ඇති වූ අතර අවුරුද්දේ අවසාන භාගයේ දී රුපියල් කෝටි 1.94ක අතිරික්තයක් පෙනිණ. එසේ වුව ද 1959 යේ අවුරුද්ද මුළුල්ලේ ම හිඟ ඇති විය. අවුරුද්දේ මුල් භාගයේ දී හිඟය රුපියල් කෝටි 8.53ක් වූ අතර අවසාන භාගයේ දී හිඟය රුපියල් කෝටි 9.15ක් (ඇස්තමේන්තු කළ පරිදි) වීමෙන් විශාල තාවකාලික හිඟයක් ඇති විය.

ත්‍රයිමාසිකව සලකන විට ජාත්‍යන්තර ගනුදෙනුවල ජංගම ගිණුම්හි 1958 දී උච්චාවචනයන් තිබුන ද 1959 දී එය පහළ බසිමින් පැවතුන බව හෙළි වේ. 1959 මුල් ත්‍රයිමාසිකයේ දී රුපියල් කෝටි 3.89ක හිඟයක් තුබූ අතර, දෙ වැනි ත්‍රයිමාසිකයේ දී එය රුපියල් කෝටි 4.64ක් විය. තෙවැනි ත්‍රයිමාසිකයේ දී මේ හිඟය කෝටි 6.46ක් වූ අතර අවසාන ත්‍රයිමාසිකය තුල තාවකාලිකව ගණන් බලා ඇති හිඟය රුපියල් කෝටි 2.69ක් වෙයි. මුල් ත්‍රයිමාසිකයන් හා සසඳන කල එය මද දියුණුවක් පෙන්වයි.

**විදේශීය සංචිත**

ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනුවල නොකඩවා පැවති ඇති හිඟයන් නිසා විදේශීය සංචිත සැළකිය යුතු ප්‍රමාණයකට පහත බැස්සේ ය. 1959 දෙසැම්බර් මාසයෙන් අවසාන වූ තුන් අවුරුද්ද තුල ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 49.0කින් පහළ වැටිණ. 1957 තේ මුල දී රුපියල් කෝටි 117.9ක් වූ මේ වත්කම් 1959 දී ඉතා පහළ මට්ටමකට එනම් රුපියල් කෝටි 68.9කට වැටිණ.

1959 වර්ෂය තුළ ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 19.5කින් පහළ වැටිණ. 1958 දී ජාත්‍යන්තර ගනුදෙනු හිඟයේ සම්පූර්ණ බර ලංකාවේ විදේශීය වත්කම් පිට නොපැවරිණ. එය ද්විපාක්ෂික වෙළඳ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වූ ලංකාවේ වගකීම් වැඩිවීම නිසා සමභාග විය. එසේ වුව ද 1959 දී ජාත්‍යන්තර ගනුදෙනුවල ප්‍රමාණවත් හිඟයක් විදේශීය වත්කම්වලින් පිරිමැසීමට සිදුවිය. මේ අවුරුද්දේ දී ජාත්‍යන්තර මුදල් මණ්ඩලයේ වැඩි කල ලංකාවේ සහභාග මුදලෙන් සියේට විසිපහක් වන ඩොලර් 75 ලක්ෂයක මුදල (රුපියල් කෝටි 3.57) විශේෂ ගෙවීමක් විය.

1959 මුල් ත්‍රයිමාසිකය තුළ දී විදේශීය වත්කම් පහළ වැටුනේ රුපියල් 4 ලක්ෂයකිනි. නමුත් ඊට පසු ත්‍රයිමාසිකවල දී ගනුදෙනු අවාසිය නොකඩවා වැඩිවත්ම විදේශීය වත්කම් සැළකිය යුතු ප්‍රමාණයන්ගෙන් ඒකාකාරව පහළ වැටුනේය. පළමු ත්‍රයිමාසිකයේ වූ සුළු පහළ බැසීමට පසු දෙ වැනි ත්‍රයිමාසිකයේ දී, විදේශීය වත්කම් පහළ බැසීමේ ශීඝ්‍රතාව වැඩි විය. දෙ වැනි ත්‍රයිමාසිකයේ කෝටි 4.48කින් ද, තුන් වැනි ත්‍රයිමාසිකයේ දී රුපියල් කෝටි 7.36කින් ද සතර වැනි ත්‍රයිමාසිකයේ දී කෝටි 7.65කින් ද, විදේශීය වත්කම් පහත බැස්සේය. ලංකාවේ විදේශීය වත්කම්හි දැනට පවත්නා දළ මට්ටම, වාර්ෂික ආයාත වටිනාකමෙන් සියයට 35 හෙවත් මාස 4ක ආයාත වටිනාකමට සමානය. විදේශීය ණය බේරුම් සඳහා පිහිටුවා ඇති නිදන් අරමුදල්හි විදේශීය වත්කම් මෙයින් ඉවත් කළ විට ශුද්ධ වත්කම්හි මුළු ප්‍රමාණය මාස තුනක ආයාත වටිනාකමට වඩා වැඩි නොවේ.

මෑත අවුරුදුවල විදේශීය වත්කම්වල පහළ වැටීම සිදු වූයේ නිර්යාත වටිනාකම් ඉහළ නගිමින් හා 1958 විදේශීය වෙළඳ අනුපාතය වාසි අතට හැරෙමින් ද තිබූ කාල පරිච්ඡේදයක වීම සැළකිල්ලට භාජනය විය යුතු ය. මේ උපනිතිය මෙලෙස ම පැවතියහොත්, හිඟ පියවිය හැකි වෙනත් සැළකිය යුතු මාර්ග නොමැත්තේ නම් දැනටමත් පිරිහී ඇති තත්ත්වය තව දුරටත් පිරිහෙනු නිසැකය. තව ද රජයේ අයවැය හිඟයන් නොකඩවා පැවතීමෙන් ද, දස අවුරුදු ජාතික සංවර්ධන ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් ද විදේශීය වත්කම් තත්වය තවත් දුර්වල විය හැකිය. විදේශීය වත්කම් මට්ටම දැනට පවත්නා විනිමය ඉල්ලීම්වලට ප්‍රමාණවත් නොවේ. ඉදිරි කාලයේ දී වැඩි වන වියදම් වේගය හා සලකා බලන විට එහි ප්‍රමාණත්වය ඊටත් නොසෑහේ. විදේශීය වත්කම් බරපතල ලෙස පිරිහීම නවත්වාලීමට තව දුරටත් උපක්‍රමයන් අවශ්‍යය. එහි අනාගත පරිහරණය පිළිබඳව ඉතාමත් ප්‍රවේශම් විය යුතු ය.

---

**සංලක්ෂය:—වෙළඳ ශෙෂය සහ භාණ්ඩ ගිණුම**

රේගු සංඛ්‍යා තොරතුරු අනුව ගණන් බලා ඇති වෙළඳ ශෙෂයෙහිත්, ජාත්‍යන්තර ගනුදෙනු සටහනෙහි, දක්වා ඇති වෙළඳ භාණ්ඩ ගිණුම් ශෙෂයෙහිත්, ඇති වෙනස,සමන් විතය, තක්සේරුව,සහ වාර්තා වන කාලය සම්බන්ධයෙන් මේ දෙකෙහි ඇති වෙනස් කම් නිසා වෙයි. පහළ දැක්වෙන හේතුන් නිසා වෙළඳ ශෙෂයේ ජාත්‍යන්තර ගනුදෙනු සටහනේ භාණ්ඩ ගිණුම් හිඟයට වඩා වැඩි හිඟයක් වෙළඳ ශෙෂයේ පිළිබිඹු වීමට ඉඩ තිබේ.

**සමන්විතය.** ''භාණ්ඩවලින් ලැබුණ ත්‍යාග'' පිළිබඳව සංඛ්‍යා තොරතුරු, වර්ෂය නිම වී මාස 8–10ක් ගත වන තෙක් නො ලැබේ. 1959 වර්ෂයට ඇතුලත් කොට ඇත්තේ, විදේශීය මුදලින් ගෙවීමක් අනවශ්‍ය වන රාජ්‍ය නීති 480 යටතේ ලැබුණු ප්‍රමාණය සහ භාණ්ඩවලින් ලැබුණු අනිකුත් ත්‍යාග, සංඛ්‍යා තොරතුරු ලැබී තිබෙන ප්‍රමාණයට පමණෙකි.

**තක්සේරුව.** වෙළඳ වාර්තාවල ආයාත සම්පූර්ණයෙන් ම සටහන් කොට ඇත්තේ රක්ෂණය හා නැව් කුලී සහිත මිල අනුවය. ජාත්‍යන්තර ගනුදෙනු සටහනෙහි එය වාර්තා වී ඇත්තේ ඉන්වොයිසි වටිනාකම අනුවය. මෙය රක්ෂණය හා නැව් කුලී සහිත මිල සහ නැව් මිල විය හැක. රජයේ ආයාතවලට දැනට ප්‍රධාන වශයෙන් ගෙවනු ලබන්නේ, නැව් මිල අනුවය. නැව් කුලී වෙනම ගෙවනු ලැබේ. එහෙයින් ජාත්‍යන්තර ගනුදෙනු සටහනේ, මේ ආයාත නැව් මිල අනුව වාර්තා වෙන අතර වෙළඳ වාර්තාවන්හි රක්ෂණය හා නැව් කුලී සහිත මිල අනුව නැව් කුලී සහතික මිල අනුව හෝ ඇතුලත් කොට ඇත. විකුණා මුදල් ගෙවන ක්‍රමයට ගෙන්වන ආයාත සඳහා යවන මුදල් නිසා මෙහි වැඩි දුරටත් වෙනසක් ඇති වෙයි. යවන නියම මුදල රේගු වාර්තාවන්හි දක්වා ඇති අනුරූප වටිනාකමට වඩා අඩුය. වෙළඳ වාර්තාවන්හි නිර්යාතයන් සටහන් කොට ඇත්තේ නැව් මිල අනුවය. මෙය ජාත්‍යන්තර ගනුදෙනු සටහනෙහි සටහන් කොට ඇත්තේ වැඩි වශයෙන් රක්ෂණය සහ නැව් කුලී ඇතුලත් වන ඉන්වොයිසි වටිනාකම අනුවය. මෙය ජාත්‍යන්තර ගනුදෙනු සටහනේ භාණ්ඩ ගිණුම් හිඟය අඩු කරයි.

**''වාර්තාවෙන කාලය''.**—සාමාන්‍යයෙන් භාණ්ඩ හුවමාරුවත් ඒ සඳහා මුදල් ගනුදෙනුවත් අතර ප්‍රමාදයක් ඇති වෙයි. යම්කිසි කාල පරිච්ඡේදයක මේ නිසා වෙළඳ ගිණුමත්, ජාත්‍යන්තර ගනුදෙනු සටහනත් අතර විශාල වෙනසක් ඇති විය හැක. මේ වෙනස ඒ කාල පරිච්ඡේදයේ දී වෙනස්වීම උඩ රඳා පවතී. 1958 අවසාන භාගයේ දී ට වඩා 1959 අවසාන භාගයේ දී වූ ආයාත ප්‍රමාණය ඉතා අධික වූ බව සැළකිය යුතුය.